නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,
පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
மாநில திறன் மேம்பாடு, தொழிற்கல்வி,
ஆராய்ச்சி மற்றும் கண்டுபிடிப்புகள் அமைச்சகம்
State Ministry of Skills Development,
Vocational Education, Research & Innovations

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
தேசிய பயிலுநர் மற்றும் கைத்தொழில் பயிற்சி அதிகாரசபை
National Apprentice & Industrial Training Authority

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT
2020








971. ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.
971, ஸ்ரீ ஜயவர்த்தனபுர மாவத்தை,வெலிக்கடை, இராஜகிரிய.
971, Sri Jayawardanapura Mawatha, Welikada, Rajagiriya

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

වාර්ෂික වාර්තාව

2020

පටුන...

සභාපතිතුමාගේ පණිවිඩය	1
සංඥාපනය	2
ඉතිහාසය	3 - 4
හැඳින්වීම	5 - 6
දැක්ම හා මෙහෙවර	7
2020.....	8 - 11
1. ආයතනික තොරතුරු	12 - 13
2. පාලක මණ්ඩලය	14
3. අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරීන්	15
4. දිස්ත්‍රික් කළමනාකරුවන්	16
5. පරිපාලන ව්‍යුහය	17
6. අධිකාරියේ අරමුණු	18
7. අධිකාරියේ ප්‍රධාන කාර්යයන්	18
8. පුහුණු ක්‍රමවේදය සහ අනෙකුත් ප්‍රධාන වැඩසටහන්	19 - 23
9. දත්ත නිරූපණය සහ විශ්ලේෂණය	24 - 58
10. අනෙකුත් ක්‍රියාකාරකම්	59 - 67
11. අවසන් ගිණුම් වාර්තා	68 - 76
12. විගණකාධිපති වාර්තාව	77 - 85

සභාපතිතුමන්ගේ පණිවුඩය.....



දැයේ දූ දරුවන් වෘත්තීය නිපුණතාවයෙන් යුතු ශිල්පීන් බවට පත්කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන 1971 අංක 49 දරන ජාතික ආධුනිකත්ව පනත යටතේ ආධුනිකත්ව මණ්ඩලය ලෙස අපගේ ආරම්භය සනිටුහන් විය. මෙලෙසින් ආරම්භ වූ ආයතනය 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය ලෙස තව දුරටත් තම වගකීම් සහ කාර්යභාරය ඉටු කරමින් 2020 වර්ෂය වන විටදී වසර 49ක සාඩම්බර ගමන් මඟක් තුළ ලාංකික සමාජයට වෘත්තීය පුහුණුව උදෙසා සුවිසල් කාර්ය භාරයක් ඉටුකරමින් සිටිනු ලැබේ.

2020 වසර තුළ කොවිඩ් 19 වෛරසය රට පුරා පැතිරයාමේ අවධානම පවතින අවස්ථාවක සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන්ට අනුගතවෙමින්, අභියෝගයන්ට සාර්ථකව මුහුණදෙමින් මෙම වසර තුළ අපගේ ආයතනික කාර්යභාරය සාර්ථක අන්දමින් ඉටු කිරීමට අපට හැකිවිය.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම සංකල්පයේ ඇතුළත් තේමාවන්ට අනුකූල වෙමින් වර්ෂය ආරම්භයේදීම වසරේ ප්‍රමුඛතම කාර්යභාරයක් ලෙස 2021-2024 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම සකස් කිරීමට "You Lead" ව්‍යාපෘතියේ අනුග්‍රහයෙන් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන කාර්යාලයේ කාර්යමණ්ඩලය, ජාතික ආයතන හා දිස්තික් කාර්යමණ්ඩල නියෝජනයෙන්, මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතාගේ ප්‍රධාන සම්පත් දායකත්වයෙන් සාර්ථකව සිදු කරන ලදී. එපමණක් නොව සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව අඩු ආදායම් ලාභී පවුල් 100,000 උදෙසා රැකියා අවස්ථා ලබාදීමේ අරමුණින් බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තුමේන්තුව සමඟින් වෘත්තීය පුහුණුව ලබාදීමේ සුවිශේෂී කාර්යභාරය ඉටුකිරීමේ පළමු අදියර සාර්ථක ලෙස දියත් කිරීම සිදුවිය.

එමෙන්ම කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ දැනට පවතින පුහුණු කිරීමේ ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණින් ඔස්ට්‍රියානු මෘදු ණය අරමුදල් (Soft Loan Fund) යටතේ නිමකරන ලද ව්‍යාපෘතිය 2020 පෙබරවාරි 27 දින ගරු අගමැති මහින්ද රාජපක්ෂ මහතා විසින් විවෘත කරන ලදී. තවත් සුවිශේෂී කටයුත්තක් ලෙස රැකියා 100,000 ව්‍යාපෘතියේ කටයුතු පහසු කිරීම වෙනුවෙන් නව තොරතුරු පද්ධතියක් (MIS) හඳුන්වාදීම හා ප්‍රධාන පරිශීලකයින් වෙත ඒ පිළිබඳ හඳුන්වාදීම වැඩසටහන සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදී.

මෙයට අමතරව මෙම වසර තුල දී CIDA ආයතනය සමඟ එක්ව ශිල්ප සවිය වැඩසටහන ක්‍රියාත්මක කරමින් පෙදරේරු, වඩු හා ජල නල කාර්මික අංශ වලින් නිපුණ ශිල්පීන් 6,000 ආසන්න පිරිසක් බිහිකිරීමටත්, ශ්‍රී ලංකා තිරසාර බලශක්ති අධිකාරිය (SLSEA) සමඟ සූර්ය පද්ධති ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම් සිදුකරනු ලබන කාර්මික ශිල්පීන් සඳහා NVQ 4 මට්ටමේ පාඨමාලාවක් පැවැත්වීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමත්, කැපිටල් මහරාජා ආයතනය සමඟ එක්ව ජල නල කාර්මික, වෑද්දුම්කරු හා ඇලුමිනියම් පිරිසැකසුම්කරු අංශ ඔස්සේ නිපුණ තාරුණ්‍යයක් බිහිකිරීමට ගිවිසුම් සඳහා එළඹීමට මූලික පියවර තැබීමත් මාගේ මූලිකත්වයෙන් සිදුවිය.

එමෙන්ම 2020 වර්ෂය තුළ ඇතිවූ බාධක හා අභියෝග වෙත මුහුණදෙමින් ආයතනික කටයුතු සාර්ථක ලෙස නිම කිරීමට කැපවූ මාගේ සහෝදර කාර්යමණ්ඩලයට හා ආධුනිකයන්ට පුහුණුව ලබාදීමට සහයෝගය පිරිනමන ලද රාජ්‍ය හා පෞද්ගලික අංශවල ආයතන වෙත ස්තූති කිරීමට මා මෙය අවස්ථාවක් ලෙස සලකමි.

තරංග නලීන් ගම්ලත්
සභාපති

සංඥාපනය

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වන වගන්තිය අනුව අධිකාරිය විසින් වාර්ෂික වාර්තාව පිළියෙල කළ යුතුව ඇත.

මෙම වාර්තාවේ කොටස් 03ක් අඩංගු වන අතර පුහුණු වැඩසටහන් වල ප්‍රගතිය පිළිබඳ විස්තර, පුහුණුව සම්බන්ධව සංවර්ධන කටයුතු සහ වර්ෂයට අදාළ සංක්ෂිප්ත වාර්ෂික ගිණුම් වාර්තාව හා විගණකාධිපති වාර්තාවෙහි ඇතුළත් නොරතුරු අන්තර්ගතකොට මෙම වාර්තාව පිළියෙල කර ඇත.

2020 වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සඳහා දිවයින පුරා ක්‍රියාත්මක වන දිස්ත්‍රික් කාර්යාල 25 හි කළමණාකරුවන් හා ජාතික ආයතන වල ආයතන ප්‍රධානීන් මෙන්ම ප්‍රධාන කාර්යාලයෙහි ඒ ඒ අංශයන්හි අංශ ප්‍රධානීන් විසින් ලබා දුන් තොරතුරු පදනම් කොට ගන්නා ලදී. එම තොරතුරු විශ්ලේෂණය කර සංක්ෂිප්තව මෙම වාර්තාව සකස් කර ඉදිරිපත් කරන ලදී.

සැලසුම් හා අධීක්ෂණ අංශය

2020

ඉතිහාසය

1. මෙයට වසර 49කට පමණ පෙර ශ්‍රී ලංකාව තුළ ඇති වූ තරුණ අසහනයට පිළියමක් ලෙස රජයේ මැදිහත් වීම මත 1971 අංක 49 දරන ජාතික ආධුනිකත්ව පනත යටතේ ජාතික ආධුනිකත්ව මණ්ඩලය පිහිටුවන ලදී. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා ජාත්‍යන්තර කම්කරු සහයෝගය ඇතිව ආධුනිකත්ව පුහුණුව සම්බන්ධ විෂයමාලා සංවර්ධනය, පුහුණු වැඩසටහන් සඳහා ප්‍රමිති නිර්ණය කිරීම, දුරස්ථ අධ්‍යාපනය සඳහා අදාළ උපදෙස් පිළියෙල කිරීම, ජාතික ශිල්පීය සහතික ප්‍රදානය කිරීම ආදී විවිධ ජයග්‍රහණයන් ජාතික ආධුනිකත්ව මණ්ඩලය යටතේ ළඟා කරගන්නා ලදී.

2. 1983 වසරේදී ප්‍රථම ජාතික පුහුණු ආයතනය ලෙස ආධුනිකත්ව අභ්‍යාස ආයතනය ජර්මන් ෆෙඩරල් ජනරජයේ ආධාර ඇතිව නො.581, ගාලූ පාර, කටුබැද්ද, මොරටුව යන ස්ථානයේ පිහිටුවන ලදී. 1985 දී දෙවන ජාතික පුහුණු ආයතනය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ ලෝක කම්කරු සංවිධානය සමඟ ඒකාබද්ධව තාක්ෂණවේදයන් පුහුණු කිරීමේ ආයතනය නමින් 18 කණුව, පන්සල පාර, කටුනායක යන ස්ථානයේ පිහිටුවන ලදී.

3. 1989 දී තෙවන ජාතික පුහුණු ආයතනය ලෙස ජපන් රජයේ ආධාර මත මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය නො.07, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය යන ස්ථානයේ පිහිටුවන ලදී.

4. ආයතනයේ කටයුතු තවත් පුළුල් කිරීම සඳහා 1990 දී අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ ii කොටස යටතේ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය ලෙස ස්ථාපිත කරන ලදී.

5. අනතුරුව ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ පරිපාලනය පළාත් කාර්යාල ලෙස විමධ්‍යගත කරන ලද අතර තව දුරටත් දිස්ත්‍රික් කාර්යාල හා පර්ෂද කාර්යාල ලෙසට ක්‍රමයෙන් විකාශනය විය.

6. තෘතීය අධ්‍යාපන පනතට අනුව ඉංජිනේරු උපාධි ආයතනයක් සහ තෘතීය අධ්‍යාපන ආයතන මගින් පවත්වාගෙන යන උසස් ඩිප්ලෝමා සඳහා අදාළ යන්ත්‍රාගාර පුහුණුව දෙනු ලැබේ.

7. හතරවන ජාතික පුහුණු ආයතනය ජර්මන් ජනරජය GIZ හා KFW ආයතන වල මූල්‍ය ආධාර මත කිලිනොච්චියේ ආරම්භ කිරීමට 2014 දෙසැම්බර් 04 දින මුල්ගල තබන ලදී.

8. 2014 සිට අනෙකුත් වෘත්තීය පුහුණු ආයතන වල ආයතනික පුහුණුව සම්පූර්ණ කරන්නන් සඳහා හය මාසයක කාර්යස්ථ පුහුණුව අධිකාරිය මගින් සපයනු ලබයි. විශේෂයෙන් කාර්මික විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික තරුණ සේවා සභාව සහ අනෙකුත් පිළිගත් රජයේ / පෞද්ගලික ආයතන වල වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පුහුණුව ලැබුවන්ට කාර්මික අංශයේ ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දීම සඳහා මෙම පුහුණුව ආරම්භ කොට ඇත.

9. හතරවන ජාතික පුහුණු ආයතනය ලෙස ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනය 2016 ජූලි 18 දින විවෘත කොට ආරම්භ කරන ලද අතර එය ජර්මානු රජයේ අවශ්‍යතාවය මත තනි ආයතනයක් ලෙස පවත්වාගෙන යාම සඳහා 2020.01.01 දින සිට අප පාලන අධිකාරියෙන් ඉවත්ව ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය යටතේ පාලනය වේ.

10. අධිකාරිය කලින් කලට නොයෙකුත් ව්‍යාපෘති හා සම්බන්ධවෙමින් කාලානුරූපව පුහුණු කටයුතු සංවර්ධනය කිරීම උදෙසා අවශ්‍ය පහසුකම් ලබාගැනීම හා එම කටයුතු ආයතනයේ පරමාර්ථ ඉෂ්ඨ කරගැනීම සඳහා යොදා ගනියි.

11. ආයතනයේ සියලුම පුහුණු කටයුතු හා සම්බන්ධ සියලු තොරතුරු පරිගණක ජාලගත කරමින් 2019 වර්ෂයේදී පුහුණු අධීක්ෂණ පද්ධතිය (T.M.S. - Training Monitoring System) ස්ථාපිත කරන ලදී.

12. වර්තමානය වන විට 13 වසරක අඛණ්ඩ අධ්‍යාපනය යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් අ.පොස. (සා.පෙ.) අසමත් දරු දැරියන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම හතරවන මට්ටම (IV) ප්‍රදානය කිරීමට කටයුතු සිදු කරයි. 2018 වර්ෂයේ සිට මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි.

13. කටුනායක කර්මාන්ත ඉංජිනේරු තාක්ෂණ ආයතනය 1985 වසරෙහි ආරම්භ කරනු ලැබුවේ සිසුන් 250කට පුහුණු කිරීමේ ධාරිතාව සහිත වන අතර ඔස්ට්‍රියානු මෘදු ණය අරමුදල් (Soft Loan Fund) යටතේ නිමකරන ලද ව්‍යාපෘතිය නිසා 2020 වර්ෂයේ සිට බඳවාගනු ලබන සිසුන්ගේ ධාරිතාව 500 දක්වා ඉහළ නංවන ලදී.

හැඳින්වීම

නෛතික ව්‍යූහය

1971 අංක 49 දරන ජාතික ආධුනිකත්ව ජාතික පනත යටතේ ජාතික ආධුනිකත්ව මණ්ඩලය ලෙස ආරම්භ කරන ලදුව 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය ලෙස ස්ථාපිත විය.

තම කාර්යභාරයන් නිසි ලෙස ඉටු කරමින් අභිමානවත් 48 වසර පසු කරන අප අධිකාරියේ 1971 සිට 2019 දක්වා වෘත්තීය පුහුණු කිරීම් ක්ෂේත්‍රය තුළ පැමිණි ගමනට විශාල ශක්තියක් එක් කළ අංශයන් පිළිබඳ බිඳක් දැක්වීමට කැමැත්තෙමු.

1. පුහුණු අංශය

බඳවාගැනීම් අංශය, පුහුණු කිරීම් අංශය, යන්ත්‍රාගාර පුහුණු අංශය, කාර්යස්ථ පුහුණු අංශය, වෘත්තීය මාර්ගෝපදේශන අංශය යන ප්‍රධාන අංශ වලින් සමන්විත පුහුණු අංශය දිස්ත්‍රික්ක 25 හරහා සමස්ත ශ්‍රී ලංකාව පුරා පුහුණු කටයුතු සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ පවත්වාගෙන යාම යන අරමුණු සාක්ෂාත් කිරීමට උරදෙමින් කටයුතු කරයි.

2. තත්ත්ව අංශය

විෂයමාලා සංවර්ධන අංශය, තත්ත්ව කළමනාකරණ අංශය, ජාතික වෘත්තීය පරීක්ෂණ අංශය, ජාතික වෘත්තීය සුදුසුකම් අංශය, ඇගයීම් අංශය, සහතික අංශය යන ප්‍රධාන අංශයන්ගෙන් සමන්විත තත්ත්ව අංශය පුහුණු අංශයේ පුහුණු කටයුතු වඩාත් ක්‍රමවත්ව සහ කාර්යක්ෂමව සිදු කිරීමට අවශ්‍ය සම්පත් සංවර්ධනය කරමින්, ආධුනිකයන්ගේ සහ ආයතනයේ ගුණාත්මකභාවය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මෙවලම් සම්පාදනය කරමින් අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීමට විශාල ශක්තියක් ලබාදේ.

3. සැලසුම් හා අධීක්ෂණ අංශය

සියලු දිස්ත්‍රික් කාර්යාල, ජාතික ආයතන, පරිපාලන, තත්ත්ව, මූල්‍ය හා පුහුණු යන සියලුම අංශයන් ආවරණය කරමින් ඔවුන්ගේ ප්‍රගතිය දත්ත කළමනාකරණ පද්ධතිය හරහා ලබා ගනිමින් මාසික ප්‍රගති වාර්තා, කාර්තුමය වාර්තා, වාර්ෂික වාර්තා සහ අවශ්‍යතාවය අනුව අනෙකුත් වාර්තා ජනනය කරමින් රේඛීය අමාත්‍යංශය ඇතුලු අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට අවශ්‍ය පරිදි තොරතුරු ලබා දෙමින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය බාහිර පරිසරය සමඟ සම්බන්ධීකරණය කිරීමට කටයුතු කරනු ලැබේ. තව ද අධිකාරියේ කටයුතු නිසි පරිදි මෙහෙයවීම සඳහා අවශ්‍ය සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ අවශ්‍යතාව අනුව විවිධ ආකාරයෙන් සැලසුම් සකස් කිරීම ප්‍රධාන වගකීම වේ. එමෙන්ම, අධිකාරියේ පුහුණු හා පුහුණුව සම්බන්ධ අධීක්ෂණය කිරීම හා පසුවිපරම් කිරීමද මෙම අංශය මඟින් ඉටු කරනු ලබයි. තවද පුහුණුවට සියලුම තොරතුරු සහ සේවකයන් සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීමට අදාළ කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළියෙල කිරීමේ හා පරිපාලනය කිරීමේ කටයුතු ද මෙම අංශයේ ප්‍රධාන කාර්යයභාරයකි.

4. පරිපාලන අංශය

නිලධාරීන් බඳවාගැනීම් අංශය, ප්‍රවාහන අංශය, ඉදිකිරීම් හා නඩත්තු අංශය, නීති අංශය, නිලධාරී පුහුණු අංශය යන ප්‍රධාන අංශ වලින් සමන්විත අතර, මානව සම්පත් හා අනෙකුත් භෞතික සම්පත් කාර්යක්ෂම ලෙස පාලනය හා උපයෝජනය කරමින් ආයතනයේ ඉදිරි ගමනට දැවැන්ත ශක්තියක් ලබාදේ.

5. මූල්‍ය අංශය

ප්‍රසම්පාදන අංශය, ගබඩා අංශය, ගෙවීම් අංශය, වැටුප් අංශය සහ පොත් තැබීම් අංශය යන ප්‍රධාන අංශ වලින් සමන්විත වන අතර වාර්ෂිකව සැලසුම් අංශය මගින් පිළියෙල කරනු ලබන ක්‍රියාකාරී හා සංයුක්ත සැලසුම් අනුව පිළියෙල කරනු ලබන වාර්ෂික අයවැය ලේඛනය නිසි අයුරින් මෙහෙයවමින් ආයතනයෙහි සියලු කටයුතු සඳහා සජීවී බවක් එක් කිරීමට ප්‍රධාන දායකත්වය ලබාදේ.

6. විගණන අංශය

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ අභ්‍යන්තර විගණන කටයුතු මෙහෙයවමින් විගණකාධිපති දෙපාර්තමේන්තුව, රේඛීය අමාත්‍යංශය ඇතලු අනෙකුත් ආයතන සමඟ සම්බන්ධ වෙමින් කටයුතු කරයි. අභ්‍යන්තර පාලනය සහ ආයතනයේ කටයුතු වල විනිවිදභාවය විධිමත් ලෙස පවත්වාගෙන යාම සඳහා විගණන හා කළමනාකරණ කමිටු සම්බන්ධීකරණය සහ කළමනාකාරීත්වයට අවශ්‍ය තොරතුරු ලබා දෙමින් විශාල මෙහෙයක් ඉටු කරනු ලැබේ.

මෙහෙයුම් ක්‍රියාවලිය

1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත අනුව ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියට ලැබී ඇති බලතල අනුව එම පනතෙහි අංක 37(1) දරන ඡේදය ප්‍රකාරව සකස් කළ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අධිකාරිය තම මෙහෙයුම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරනු ලබයි.

මේ සඳහා පුහුණු සංකල්ප යටතේ ජාතික ආයතන 04ක්, දිස්ත්‍රික් කාර්යාල 25ක්, පුහුණු අනුබද්ධ ආයතන හා අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික අංශ දායක කරගත් කර්මාන්ත ආශ්‍රිත පුහුණුව ලබාදීම සිදු කරයි.

පුහුණුව සඳහා බඳවා ගැනීම, සුපරීක්ෂණය, අධීක්ෂණය, සහතිකකරණය ආදී අංශ ගණනාවක් යටතේ සෘජුවම පුහුණු මෙහෙයුම් කටයුතු සිදු වේ. ඊට අමතරව කළමනාකරණය හා පරිපාලනය, සේවක පුහුණුව, යටිතල පහසුකම් සංවර්ධනය මූල්‍ය හා විගණනය ඊට ඇතුළත් වේ.

දැක්ම

මානව සම්පත් සංවර්ධනය මඟින් ශ්‍රී ලංකාවේ සමෘද්ධිය සැලසීම සඳහා සාර්ථක දායකත්වයක් දෙමින් කාර්යක්ෂම පුහුණු කිරීමේ ආයතනය බවට පත්වීම.

මෙහෙවර

කර්මාන්ත ක්ෂේත්‍රයේ නිපුණ මිනිස් බල අවශ්‍යතා සපුරාලනු පිණිස මනාසේ සකසන ලද උසස්ම වෘත්තීය මට්ටමේ නිපුණතා පුහුණු වැඩසටහන් තුළින් තරුණ තරුණියන් හට වෘත්තීය හා කාර්මික පුහුණුව ලබා දීම.

2020.....

කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව	10,807
රැකියාස්ථ පුහුණුව	8,064
විශේෂ කර්මාන්ත පුහුණුව	3,962
මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව	2,841
මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව (අර්ධ කාලීන)	559

අඩ සියවසකට ආසන්න 49 වසරක අභිමානවත් මෙහෙවර සමඟින් 2020 වර්ෂය තුළ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය මෙම වසර තුළ දී කොවිඩ් 19 උවදුර දිවයින පුරා පැනිර යන අවස්ථාවකදී එම අවධානමට සාර්ථකව මුහුණදෙමින් අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව අඩු අදායම්ලාභී පවුල් 100,000 උදෙසා රැකියා අවස්ථා ලබාදීමේ අරමුණින් බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව සමඟින් වෘත්තීය පුහුණුව ලබාදීමේ සුවිශේෂී කාර්යභාරය සමඟින් 2020 වර්ෂය තුළ අප විසින් ඉටුකළ කර්යභාරය මෙලෙසින් සනිටුහන් කරනු ලබන වගයි.

සාම්ප්‍රදායික චාරිත්‍රානුකූලව රාජ්‍ය ප්‍රතිඥාව ලබාදෙමින් 2020 වර්ෂයේ වැඩකටයුතු ආරම්භය සිදුවූ අතර වසර ආරම්භයේදී සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කටුබැද්ද කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය හා ඔරුගොඩවත්ත මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පළමු සිසුන් කණ්ඩායම බඳවාගැනීමේ සමාරම්භක උළෙල පැවැත්විණි.

13 වසරක අධ්‍යාපන ක්‍රමවේදය වැඩසටහන යටතේ පුහුණුව නිම කළ සිසුන් සඳහා කාර්යස්ථ පුහුණුව ලබාදීමේ ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සභාපති, උප සභාපති, සියලුම අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් කළමනාකරුවන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිතයින්, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශ නියෝජිතයින් හා රාජ්‍ය හා පෞද්ගලික පුහුණු සපයන ආයතනවල නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් සිදුවිය.



කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ දැනට පවතින පුහුණු කිරීමේ ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණින් ඔස්ට්‍රියානු මෘදු ණය අරමුදල් (Soft Loan Fund) යටතේ නිමකරන ලද ව්‍යාපෘතිය 2020 පෙබරවාරි 27 දින ගරු අගමැති මහින්ද රාජපක්ෂ මහතා විසින් විවෘත කරන ලදී.

ශ්‍රී ලංකා තිරසාර බලශක්ති අධිකාරිය (SLSEA) සමඟ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සූර්ය පද්ධති ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම් සිදුකරනු ලබන කාර්මික ශිල්පීන් (Solar Proteolytic Technician) සඳහා NVQ 4 මට්ටමේ පාඨමාලාවක් පැවැත්වීම සඳහා අවබෝධනා ගිවිසුමක් අත්සන් කිරීම සිදුවිය.

2021-2024 කාලපරිච්ඡේදය වෙනුවෙන් සංයුක්ත සැලැස්ම සකස් කිරීම සඳහා මූලික අදියරෙහි කටයුතු ආරම්භ කිරීමට විශේෂිත සාකච්ඡාවක් ආයතන පරිශ්‍රයේදී සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රධානත්වයෙන් පැවැත්විණි.



"You Lead" ව්‍යාපෘතියේ අනුග්‍රහයෙන් 2021-2024 කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම සකස් කිරීම වෙනුවෙන් තෙදින වැඩමුළුවක් වත්තල පෙගසස් රීෆ් හෝටල් (Pegasus Reef Hotel) පරිශ්‍රයේදී සාර්ථකව පැවැත්විණි. මේ සඳහා මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතා හා "Colombo School of Business Management" හි සම්පත් දායකයන් හා නයිටා ආයතනයේ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන කාර්යාලයේ කාර්යමණ්ඩලය, ජාතික ආයතන හා දිස්ත්‍රික් කාර්යමණ්ඩල නියෝජනයෙන් සාර්ථක ලෙස නිමාවට පත්විය.



RPL ක්‍රමවේදය යටතේ NVQ සහතිකපත්ලාභීන් 155 දෙනෙකු උදෙසා සහතිකපත් ප්‍රදානය කිරීමේ අවස්ථාව සඳහා අමාත්‍යාංශය භාර ගරු දිනේෂ් ගුණවර්ධන මහතා හා අප සභාපතිතුමා හා උප සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කැණිමඩල ශ්‍රවණාගාරයේදී සිදුවිය.

ශිල්ප සවිය වැඩසටහන යටතේ CIDA ආයතනය සමඟ එක්වී ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු), දැව ශිල්පී (ගොඩනැගිල්ල), ටයිලර් සහ විදුලි කාර්මික යන ක්ෂේත්‍ර යටතේ නිපුණ ශිල්පීන් 6,000 ක් පමණ පුහුණු කිරීමට අවබෝධතා ගිවිසුමකට එලඹීම සඳහා නයිටා සභාපතිතුමා හා උප සභාපතිතුමා ඇතුළු CIDA ආයතනයේ නියෝජිතයන් සමඟ එක්වී විශේෂ සාකච්ඡාවක් පවත්වන ලදී.

"You Lead" ව්‍යාපෘතිය හා අප අධිකාරිය එක්ව නවීකරණය කළ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන හඳුන්වාදීම අප අධිකාරියේ උප සභාපතිතුමා, "You Lead" ව්‍යාපෘති අධ්‍යක්ෂ හර්ෂ ද සිල්වා මහතා, ප්‍රේමසිරි ගමගේ මහතා හා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගිත්වයෙන් සිදුවිය.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම සංකල්පයේ ඇතුළත් තේමාවන්ට අනුකූල වෙමින් අඩු අදායම්ලාභී පවුල් 100,000 උදෙසා රැකියා අවස්ථා ලබාදීමේ අරමුණින් බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව සමඟින් ආරම්භ කරන ලද පුහුණුව

ලබාදීමේ සුවිශේෂී කාර්යභාරය ඉටුකිරීමේ වැඩසටහන දියත් කිරීම සඳහා අපගේ අමාත්‍යාංශය භාර ගරු දිනේෂ් ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ පරිශ්‍රයේදී අප ආයතනයත් බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තුමේන්තුව සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම සිදුවිය.

2020 ජූලි 8 වන පනාගොඩ හමුදා කඳවුරේ දී රැකියා 100,000 නිපුණතා පුහුණු වැඩසටහන සඳහා තෝරාගත් ප්‍රතිලාභීන්ගේ රැස්වීමක් අධිකාරියේ සභාපති සහ උප සභාපති හා නන්ද මල්ලවආරච්චි මහතා සහ අනෙකුත් හමුදා නිලධාරීන් ද සහභාගීත්වයෙන් පවත්වන ලදී.







නයිටා ආයතනයේ දැනට පවත්නා "හෙද" කර්මාන්ත ශිල්පීය පාඨමාලාව සහ "හෙද සහකාර NVQ 4" පාඨමාලාව මාලාව " හෙද NVQ මට්ටම 06" ඩිප්ලෝමා පාඨමාලාවක් ලෙස තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සහ පෞද්ගලික රෝහල් හා හෙද නිවාස සංගමයේ සහයෝග යෙන් වැඩි දියුණු කර ඇත. මෙහි පළමු සිසු කණ්ඩායම බඳවා ගැනීම ලංකා පෞද්ගලික රෝහල් පරිශ්‍රයේදී සිදුවිය.



NVQ-RPL ක්‍රමවේදය හරහා රූපලාවන්‍ය ශිල්පීන් 1000 ක් නිපුණ ශිල්පීන් බවට පත්කිරීමේ වැඩසටහනෙහි පළමු අදියර සාර්ථක අන්දමින් ශ්‍රී ලංකාවේ පළපුරුදු ප්‍රසිද්ධ ශිල්පීන් රැසකගේ සහභාගිත්වයෙන් පැවැත්විය.

ශ්‍රී ලංකාවේ ප්‍රථමවරට ජනමාධ්‍යවේදීන් උදෙසා NVQ සහතික පත්‍ර ලබාදීමේ වැඩසටහනට අයදුම් කල පිරිස වෙත ඒ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන නයිටා කැණිමඩල ශ්‍රවණාගාරයේදී පැවැත්වුණු අතර නරේන්ද්‍ර රාජපක්ෂ මහතා මෙහිදී සම්පත්දායකයකු ලෙස මෙම අවස්ථාවට සහභාගි විය.

උප සභාපතිතුමාගේ සංකල්පයකට අනුව සේවක රසාස්වාදය ඉහළ නැංවීම සඳහා සෑම මසකම අවසන් සිකුරාදා දින සුවිශේෂී වැඩසටහනක් පැවැත්වීම.







බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තුමේන්තුව අප ආයතනය සමඟ එක්ව රැකියා ලක්ෂය වැඩසටහනෙහි පළමු අදියර දියත් කරමින් වෘත්තීය ලැදියාව පිළිබඳ පරීක්ෂණ (Career Key Test) පවත්වා පුහුණු ක්ෂේත්‍රය තෝරාගැනීම පිළිබඳ පරීක්ෂණය පැවැත්වීම පිළිබඳ සාකච්ඡාවක් ජාතික තරුණ සේවා සභාවේ සභාපතිතුමත් බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තුමේන්තුවේ නියෝජිතයන් හා නයිටා ආයතනයේ සභාපතිතුමා හා උප සභාපතිතුමගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. රැකියා ලක්ෂය පළමු අදියරෙහි පත්වීම් ලද පිරිස නයිටා ආයතනය සමඟ එක්ව වෘත්තීය පුහුණුව ඇරඹීමේ සමාරම්භක උළෙල කෑගල්ල කාර්මික විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණි. ඉන් පසුව දිවයින පුරා සාර්ථක අන්දමින් පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන හා න්‍යායික පන්ති ආරම්භය සිදුවිණි.

රැකියා 100,000 ව්‍යාපෘතියේ කටයුතු පහසු කිරීම වෙනුවෙන් නව තොරතුරු පද්ධතියක් (MIS) හඳුන්වාදීම හා ප්‍රධාන කාර්යාල හා දිස්ත්‍රික් මට්ටමේ පරිශීලකයින් වෙත ඒ පිළිබඳ හඳුන්වාදීමේ වැඩසටහන අප ආයතනයේ ප්‍රධාන ශාලාවේදී පැවැත්විය. රැකියා 100,000 නිපුණතා සංවර්ධන වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා අදාළ වන Office 365 හඳුන්වා දීමේ වැඩසටහන 2020 ජූනි 17 දින පැවැත්විණි. එම අවස්ථාවට නයිටා හි සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ මණ්ඩලය සහභාගී වූහ.







නයිටා සහ ෆිටිස් (FITS) අතර අත්සන් තැබූ අවබෝධතා ගිවිසුම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ පුහුණුවන්නන් සඳහා ඩිජිටල් තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව (HDDT) සංවර්ධනය කිරීම පිළිබඳව ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ සම්මේලනයේ නියෝජිතයන් සමඟ විශේෂ සාකච්ඡාවක් අප ආයතන පරිශ්‍රයේදී සිදුවිය.

S - Lon Pvt Ltd ආයතනය සමඟ දැනට පවත්නා ගිවිසුම දීර්ඝ කර ගැනීමත් සමඟ නිපුණ ශිල්පීන් බිහිකිරීමේ අවස්ථාවන් පුළුල් කරගැනීමටද මෙම වසරෙහි හැකිවිය. එයට අමතරව කැපිටල් මහරාජා ආයතනය සමඟ එක්ව ජල නල කාර්මික, වෑද්දුම්කරු හා ඇලුමිනියම් පිරිසැකසුම්කරු අංශ ඔස්සේ නිපුණ තරුණයන් බිහිකිරීමට ගිවිසුම් සඳහා එළඹීමේ මූලික පියවර තැබීම මෙම වසරේ සිදුවිය.

50 වසරක සැමරුම අභියස සිටිනා අප ආයතනයයේ අභිවෘද්ධිය වෙනුවෙන් වසර අවසානයේ බෞද්ධ ආගමික චාරිත්‍ර අනුව ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩල සේවක මහත්ම මහත්මීන්ගේ සහභාගිත්වයෙන් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී පිරිත් පිංකම හා ආගමික වතාවත් සිදු කෙරුණි.







ආයතනික තොරතුරු


දිස්ත්‍රික් කාර්යාල හා ජාතික ආයතන
ප්‍රධාන කාර්යාලය
දිස්ත්‍රික් කාර්යාල
ජාතික ආයතන
යාපනය
කිලිනොච්චිය
මන්නාරම
මුලතිව්
වවුනියාව
තිකුණාමලය
අනුරාධපුරය
පොළොන්නරුව
පුත්තලම
මාතලේ
මඩකලපුව
කුරුණෑගල
මහනුවර
කුලුනායක
කෑගල්ල
අම්පාර
ගම්පහ
බදුල්ල
නුවරඑළිය
ඔරුගොඩවත්ත
මොණරාගල
කොළඹ
ප්‍රධාන කාර්යාලය
කටුබැද්ද
කළුතර
රත්නපුරය
ගාල්ල
හම්බන්තොට
මාතර

	ප්‍රධාන කාර්යාලය 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය. දූ.ක. 011-2888782 - 7
01	**ඉංජිනේරු තාක්ෂණික ආයතනය** 18 කණුව, පන්සල පාර, කටුනායක. දූ.ක. 011-2252833
02	**කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය** නො. 581, ගාලුපාර, කටුබැද්ද, මොරටුව. දූ.ක. 011-2647393, 011-2643847
03	**මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය** නො. 69-ඒ, බෙස්ලයින් පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය. දූ.ක. 011-2572977
	අම්පාර දිස්ත්‍රික් කාර්යාලය නො. 06, ජී. එස්. පටුමග, කල්මුණායිකුඩි 13, කල්මුණේ. දූ.ක. 067-2229357
	අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය ගුවන් තොටුපල මාවත, අනුරාධපුරය. දූ.ක. 025-2223178
	බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය 4/10, මල්වත්ත පාර, බදුලුපිටිය, බදුල්ල. දූ.ක. 055-2230644
	මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලය නො.16/1, නව කල්මුණේ පාර, මඩකලපුව. දූ.ක. 065-2228130
	කොළඹ දිස්ත්‍රික් කාර්යාලය නො. 242, හැව්ලොක් ටවුම, කොළඹ 05. දූ.ක. 011-2587258, 011-2597671
	ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය නො. 393, වක්වැල්ල පාර, ජූල්ගහ, ගාල්ල. දූ.ක. 091-2235628
	ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය නො.61/5, මීනුවන්ගොඩ පාර, ගම්පහ. දූ.ක. 033-2232874
	හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය නො.39, පල්ලික්කුඩාව පාර, තංගල්ල. දූ.ක. 047-2241512
	යාපනය දිස්ත්‍රික් කාර්යාලය නො. 44, සෝමසුන්දරම් ඇවිනිව්, චුන්දිකුලි, යාපනය. දූ.ක. 021-2222383
	කළුතර දිස්ත්‍රික් කාර්යාලය 326/2, 3 වන මහල, කෙළින් වීදිය,ගාලුපාර, කළුතර දකුණ. දූ.ක. 034-2224239

	මහනුවර දිස්ත්‍රික් කාර්යාලය 108/2/බී, තිවංක බෝධි මාවත, මහනුවර. දූ.ක. 081-2201918
	කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය බණ්ඩාරනායක මාවත, බල්ලපාන, ගලිගමුව. දූ.ක. 035-2284931
	කිලිනොච්චි දිස්ත්‍රික් කාර්යාලය නුවර පාර,අනදපුරම්, කිලිනොච්චිය. දූ.ක. 0343942824
	කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය මීගමුව පාර, මල්කඩුවාව, කුරුණෑගල. දූ.ක. 037-2223789
	මාතර දිස්ත්‍රික් කාර්යාලය නො. 27 ඒ, විවෘත විශ්ව විද්‍යාල පාර, නුපේ, මාතර. දූ.ක. 041-2226958
	මන්නාරම දිස්ත්‍රික් කාර්යාලය 952/1, තල්ලයාර් වීදිය, පරණ බූර් වීදිය, මන්නාරම. දූ.ක. 023-2223404
	මාතලේ දිස්ත්‍රික් කාර්යාලය නො.11, පන්සල පාර, මණ්ඩන්ඩාවල, මාතලේ. දූ.ක. 066-2223173
	මොණරාගල දිස්ත්‍රික් කාර්යාලය උසාවි සංකීරණය, මොණරාගල. දූ.ක. 055-2276504
	මුලතිව් දිස්ත්‍රික් කාර්යාලය මාන්කුලම් පාර,මුල්ලියාවෙලෙ, මුලතිව්. දූ.ක. 021-2061012
	නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය නො. 116, කෝවිල් පාර, හාවාඑළිය, නුවරඑළිය. දූ.ක. 052-2223702
	පොලොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය නො. 103, වාරිමාර්ග පෙදෙස, නවනගරය, පොළොන්නරුව. දූ.ක. 027-3223023
	පුත්තලම දිස්ත්‍රික් කාර්යාලය මෝලවත්ත, මැදගම පාර, මාදම්පේ. දූ.ක. 032-2248250
	රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය නො. 642, විද්‍යාල මාවත, නව නගරය, රත්නපුර. දූ.ක. 045-2228667
	ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාර්යාලය නො.103/7, තැපැල් කාර්යාලය පාර, ත්‍රිකුණාමලය. දූ.ක. 026-2226569
	වවුනියාව දිස්ත්‍රික් කාර්යාලය ඕල් පාර්ක් පාර, වවුනියාව. දූ.ක. 024-2224679

02. පාලක මණ්ඩලය

1. තරංග නලීන් ගමිලත් මහතා
සභාපති
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

2. මහාචාර්ය මහින්ද රූපසිංහ
උප සභාපති
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

3. ජේ.ඒ.ඩී.ජේ. ජයලත් මහතා
වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව,
අංක 354/2, ඇල්විටිගල මාවත,
කොළඹ 05.

4. එස්.පී. ශ්‍රියාකාන්ති මිය
ව්‍යාපෘති දෙපාර්තමේන්තුව,
කළමනාකරණය සහ අධීක්ෂණය,
මුදල් අමාත්‍යාංශය,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

5. ජේ.සී.කේ. බස්නායක මහතා
අංක 2 / ඒ / 25, ජයවඩනගම,
බත්තරමුල්ල.
මොහමඩ් මික්ඩාඩ් මහතා
අංක 89/2, දෙහිවල පාර,
පැපිලියාන, බෝරලැස්ගමුව.

6. මොහමඩ් මික්ඩාඩ් මහතා
අංක 89/2, දෙහිවල පාර,
පැපිලියාන,
බෝරලැස්ගමුව.

7. ලක්සෙන් අබේගුණසේකර මහතා
අංක 524, "අබෙසිර්"
ගෝනවල, කැළණිය.

8. ගයාන් මේනක දිසානායක මහතා
අංක 82/1, අරලිය උයන,
"සෙනාරා", පල්ලෙගම,
ඇඹිලිපිටිය.

9. ජනක කමල්ගොඩ මහතා
අංක 136 X, පරණ කැස්බෑව පාර,
ගංගොඩවිල,
නුගේගොඩ.

10. හසිත ඒකනායක මහතා
අංක 79/5, මොරගහමුල,
මැදමහුනවර,
මහනුවර.

11. රංග පෙරේරා මහතා
සතර ආයතනය,
මහරගම.

12. එස්.කේ.වයි.ජී.එස්.කේ.සෙනරත් මහතා
අංක 309, කොළඹ පාර,
ගම්පහ.

13. එස්.ඒ.ඩී. තිලක් ප්‍රේමලාල් මහතා
අංක 123/1 ඒ, දුම්රිය ස්ථානය,
ගංගොඩවිල,
නුගේගොඩ.

14. සහන් ද සිල්වා මහතා
අංක 1009/18, 8 වන පටුමග,
සුමුදු මාවත,
මාලඹේ.

15. ක්‍රිෂාන් සියඹලාපිටිය මහතා
සම්බන්ධීකරණ ලේකම්,
නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ,
සමාජ පිරිසිදුකම සහ අපද්‍රව්‍ය
කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
18 වන මහල, සුහුරුපාය
ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරීන්

1. තරංග නලීන් ගම්ලත් මහතා	සභාපති
2. මහාචාර්ය මහින්ද රූපසිංහ මහතා	උප සභාපති
3. ටී.පී.මුදිතා පද්මජායී	අධ්‍යක්ෂ ජනරාල් වැ.බ.
4. පී.ආර්. රොද්‍රිගෝ මහතා	අධ්‍යක්ෂ (සැලසුම් හා අධීක්ෂණ)
5. ආර්.එම්.ඒ.පී. සමරදිවාකර මහත්මිය	අධ්‍යක්ෂ (තත්ත්ව)
6. සුමේධ ජයසිංහ මහතා	අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්)
7. පී.එච්.වී.එන්.ඩබ්. ද සිල්වා මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ / අධ්‍යක්ෂ (පුහුණු) වැ.බ. (01.07.2019 සිට මේ දක්වා)
8. එන්.ඩබ්.එන්. සඳමාලි මහත්මිය	අභ්‍යන්තර විගණක / අධ්‍යක්ෂ (මුදල්) රා.ඉ. (11.06.2020 සිට මේ දක්වා)
9. ටී.පී.කේ. පෙරේරා මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ (තත්ත්ව)
10. සී.පී. සුබසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
11. එම්.අයි.එම්. අසාර් මහතා	අධ්‍යක්ෂ (මුදල්) රා.ඉ. (25.05.2020 දක්වා) - ගණකාධිකාරී (SLGTI - 26.05.2020 දක්වා)
12. එස්.වී.පී. වික්‍රමසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (ඇගයීම්)
13. ඩබ්.ඒ.කේ.එස්. කුමාර මහතා	සහකාර අධ්‍යක්ෂ (කාර්යස්ථ පුහුණු) / සහකාර අධ්‍යක්ෂ (විශේෂ කාර්මික පුහුණු)
14. ඒ.ජේ. පතිරණ මහතා	සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)
15. එම්.එල්.පී. ප්‍රනාන්දු මහතා	සහකාර අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශන හා අලෙවි)
16. පී.පී. සුනිල් මහතා	සහකාර අධ්‍යක්ෂ (Craft Evaluation EBT,CBT)
17. ආර්.ඩබ්.එම්.ඒ.ජේ. රත්නායක මහතා	සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ)
18. යූ.එම්. ප්‍රබෝෂිනී මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (ගිණුම් හා පාලන)
19. එන්.ඩී.පී. උස්ගොඩාරච්චි මහතා	සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා සැපයුම්)
20. ටී.එස්.පී.ඒ. වික්‍රමසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)
21. පී.එම්. විතානගේ මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (පුහුණු සේවා)
22. ඒ.එච්.එස්.පී. විජේරත්න මහතා	සහකාර අධ්‍යක්ෂ (අධීක්ෂණ)
23. එම්.එම්.පී. ප්‍රනාන්දු මහතා	පුහුණු කළමනාකරු/ සහකාර අධ්‍යක්ෂ (නඩත්තු හා සිවිල්) වැ.බ.
24. එම්.ජී.පී.ටී. මල්කාන්ති මහත්මිය	පුහුණු නිලධාරී/ සහකාර අධ්‍යක්ෂ (SSCD හා LRD) වැ.ආ.
25. පී.එම්. කුමාරසිංහ මිය	අධ්‍යක්ෂ/ විදුහල්පති - IETI (2016.05.01 දින සිට විශ්‍රාම ගියාය)
26. එම්.එච්.එන්.පී.ධර්මසිරි මහතා	අධ්‍යක්ෂ/ විදුහල්පති (වැ.ආ.) - IETI (04.08.2020 සිට මේ දක්වා)
27. ඩී.ආර්. සපුතන්ත්‍රී මහතා	අධ්‍යක්ෂ/ විදුහල්පති - IET
28. එච්.ඒ.එන්.ඩී. කුමාරි මහත්මිය	අධ්‍යක්ෂ/ විදුහල්පති - AETI

දිස්ත්‍රික් කළමනාකරුවන්

හම්බන්තොට	එස්.ඩී.අබේවික්‍රම මහතා
අම්පාර	ඒ. මසූර් මහතා
කෑගල්ල	ඩී.ඩී. පියලත් මිය
කොළඹ	එම්.ආර්.ඩී.ඒ.එස්.ගුණරත්න මහතා
මාතර	යූ.එම්.කේ.නානායක්කාර මහතා
බදුල්ල	පී.කේ.පී.ගුණවර්ධන මහතා
ගාල්ල	පී. නාරන්ගොඩ මහතා
මාතලේ	බී.එම්.ජේ.එස්.කේ. රණරාජා මහතා
වව්නියාව	එස්. පවලනාතන් මහතා (06.07.2020 දින සිට විශ්‍රාම ගියේය) එස්. සුබාෂ් මහතා (වැ.ආ.) (20.07.2020 සිට මේ දක්වා)
මඩකලපුව	එස්.ඒ.එම්.එස්.එම්. සලීම් මවුලානා මහතා
මන්නාරම	එස්. වීනස් මහතා
මහනුවර	බී.ඒ.යූ.ඒ. කරුණාරත්න මහතා
යාපනය	පී.ටී. රත්නකුමාර මහතා (වැ.ආ.)
පුත්තලම	ජේ. උදයවර්ධන මහතා (වැ.ආ.)
ගම්පහ	ඒ.පී.ඩී.විජේරත්න මහතා (වැ.ආ.)
කළුතර	එච්.එම්.ඩී.ඒ.කේ.විජේරත්න මිය
අනුරාධපුර	ටී.එම්.ටී.බී.කරුණාරත්න මහතා (වැ.ආ.)
මොණරාගල	එස්.පී.සී.ජේ. මෛත්‍රීදාස මහතා (වැ.ආ.)
කුරුණෑගල	ආර්.එම්.එන්.එස්.කේ.රත්නායක මහතා (වැ.ආ.)
රත්නපුර	වයි.එස්.පියතිලක මහතා (වැ.ආ.)
පොලොන්නරුව	යූ.පී.එන්.සමීර මහතා (වැ.ආ.)
මුලතිව්	එස්.සිවගෞරි මිය (වැ.ආ.)
ත්‍රිකුණාමලය	කේ.පත්මනාදන් මහතා (වැ.ආ.)
කිලිනොච්චි	වයි.යෝකේස්වරන් මහතා (වැ.ආ.)
නුවරඑළිය	ඩී.ඒ.ඩී.සූරියබන්ඩාර මහතා (වැ.ආ.)


National Apprentice & Industrial Training Authority
Organizational Structure
Chairman /CEO
Vice Chairman
Director General
Director Admin. & H.R.
Director Training
National Institutes (IET/AETI/IETI)
Director Quality
Director Planning & Monitoring
Director Finance
Districts
A.D. General Admin
A.D. Maint.& Constr.
A.D. HRM
A.D. HRD
A.D. Training Service
A.D. Training Admin
A.D. SIT
A.D. CJT
A.D. C.G.& Marketing
A.D. Quality
A.D. NSS
A.D. Assesment
A.D. Certificate
A.D. Information Systems
A.D. Planning
A.D. Monitoring
A.D. Acc. & Controll
Internal Auditor
I.A.O
VRU Officer
Trp. Officer
Drivers
Tech. Officer
Drft.M. M.A.
A.O
M.A.
T.O.
Inspec.
Inspec
Q.A. Off.
Sys. Adm
D.B Adm
Stat. cian
Acct. Officer
Proc. Officer
Acct. Officer
B/ Sec Leg.Off
Book Keeper
Management Asst.
Office Aide

අධිකාරියේ අරමුණු

සංස්ථාපිත කිරීමේ පනතෙහි අංක 37 (1) දරන ඡේදය අනුව අධිකාරියේ පරමාර්ථ පහත පරිදි වේ.

(අ) වෘත්තීය පුහුණුව සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා ලබාදීම.

(ආ) වෘත්තීය පුහුණුවට අදාළ පුහුණු සම්මතයන් නිශ්චය කිරීම.

(ඇ) වෘත්තීය පුහුණුවට අදාළව විභාග පැවැත්වීම හා සහතික පත්‍ර සහ වෙනත් ප්‍රධානයන් නිකුත් කිරීම.

(ඈ) ජාතික ශිල්පීය පරීක්ෂණය පැවැත්වීම.

(ඉ) වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් කිරීම.

(ඊ) විවිධ දක්ෂතා වැඩිදියුණු කිරීම ප්‍රවර්ධනය පිණිස තරඟ පැවැත්වීම.

(උ) වෘත්තීය පුහුණුව සලස්වන ආයතනවල සහ වෙනත් ආයතනවල පුහුණු කිරීමේ හැකියාවන් සංවර්ධනය කිරීම.

(ඌ) වෘත්තීය පුහුණු කිරීම් සම්බන්ධයෙන් වෘත්තීය පුහුණු කොමිෂන් සභාවට උපදෙස් දීම.

(එ) සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ සහ විදේශවල පිහිටි ආයතන සමඟ සම්බන්ධකම් ඇති සහතික, ඩිප්ලෝමා සහ උපාධි සමතත්වයෙහිලා සැලකීම සඳහා අදාළ කටයුතු කිරීම සහ බලාත්මක කිරීම.

අධිකාරියේ ප්‍රධාන කාර්යයන් / වැඩසටහන්

(අ) රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධ වී කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව ලබාදීම, පුහුණු ආයතන 04ක් සහ දිවයිනපුරා පිහිටුවා ඇති ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථාන මඟින් ද්විත්ව පුහුණුව ලබාදීම.

(ආ) වෙනත් වෘත්තීය පුහුණුවන්නන් සඳහා විවිධ ආයතන වලට යොමුකොට කාර්යස්ථ පුහුණුව ලබාදීම.

(ඇ) මොරටුව, පේරාදෙණිය සහ රුහුණු විශ්ව විද්‍යාලයන්හී ඉංජිනේරු උපාධි අපේක්ෂක සහ අනෙකුත් ඩිප්ලෝමා හදාරන සිසුන් සඳහා අවශ්‍ය යන්ත්‍රාගාර පුහුණුව ලබාදීම.

(ඈ) අවිධිමත් ලෙස නිපුණතාව ලැබූ කර්මාන්ත ශිල්පීන්ට පෙර ඇගයීම් ක්‍රමයට ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ලබාදීම, වෘත්තීයට අදාළ පරිදි සුදුසුකම් සහතික ලබාදීම සහ අදාල ජාතික වෘත්තීය පරීක්ෂණ පැවැත්වීම.

(ඉ) වෘත්තීය පුහුණු ආයතනවල පුහුණුකරුවන් පුහුණු කිරීම.

(ඊ) පාසල් සිසුන්, පාසල් හැරගිය සහ අනෙකුත් ඉලක්ක කණ්ඩායම් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම.

පුහුණු ක්‍රමවේදය සහ අනෙකුත් ප්‍රධාන වැඩසටහන්

පුහුණු ක්‍රමවේදය ප්‍රධාන වශයෙන් කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව, ආයතනික පුහුණුව/ මධ්‍යස්ථාන පාදක ද්විත්ව පුහුණුව, යන්ත්‍රාගාර පුහුණුව, කාර්යස්ථ පුහුණුව ලෙස වර්ග කළ හැකිය.

■ කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව

ආයතනය මඟින් පවත්වාගෙන යනු ලබන පුහුණු කටයුතු අතර ප්‍රධාන පුහුණු ක්‍රමවේදය මෙය වන අතර, කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණු කිරීම් සඳහා අධිකාරිය ලත් ශ්‍රී ලංකාවේ එකම රාජ්‍ය ආයතනය ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය වේ. මෙම පුහුණු ක්‍රමවේදයේදී පුහුණු වන්නන් පුහුණු කාලය තුළ වැඩ කරමින් ඉගෙන ගැනීම මඟින් අවශ්‍ය නිපුණතා ලබා ගන්නා අතර ඒ කර්මාන්ත සඳහා ඔහු හෝ ඇය අනුයුක්ත කරනු ලැබේ.

මෙහිදී පුහුණුලාභියා හට පහත ක්‍රමවේදයන් එකක් යටතේ පුහුණුව ලබා ගැනීමට හැකියාව ඇත.

i. කර්මාන්ත ශිල්පී ආධුනිකත්ව පුහුණුව

ii. ජාතික වෘත්තීය සුදුසුකම සහතික ක්‍රමය

iii. ස්ථානානුරූපී ආධුනිකත්ව පුහුණුව

iv. ග්‍රාමීය ආධුනිකත්ව පුහුණුව

■ කර්මාන්ත ශිල්පී ආධුනිකත්ව පුහුණුව

එක් එක් ක්ෂේත්‍රයට විශේෂිත වූ ජාතික පුහුණු හා කර්මාන්ත උපදේශක කමිටුව (NITAC) මඟින් එක් එක් ක්ෂේත්‍රයන්ට පුහුණු සම්මතයන් පිළියෙලකොට එම පුහුණු සම්මතයන්ට අනුකූලව පුහුණු කටයුතු සිදු කිරීමට කර්මාන්ත හිමියන් හා ආධුනිකයා අතර ගිවිසුමකට එළඹීමෙන් පසු එක් එක් ආයතන වල ආධුනිකත්ව පුහුණුව ආරම්භ කළ හැකිය.

■ ජාතික වෘත්තීය සුදුසුකම සහතික ක්‍රමය (NVQ)

ආධුනිකත්ව පුහුණුව යටතේ වෘත්තීන් 51ක් පදනම් කරගෙන 2016 වර්ෂයේ සිට ආරම්භ කරන ලදි. මෙම ක්‍රමයේ දී කර්මාන්ත ශිල්පී ආධුනිකත්ව ක්‍රමයෙන් කර්මාන්ත හිමියන් හා ආධුනිකයා අතර ගිවිසුමකට එළඹීමෙන් පසු එක් එක් පුහුණු ආයතනවල පුහුණුව ආරම්භ කළ හැකිය. මෙම ක්‍රමය තුළ පුහුණු ආයතන /කර්මාන්ත තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම් සභාව යටතේ ප්‍රතීතනය කිරීමට සිදු කළ යුතු අතර ආධුනිකයන් නිරන්තර ඇගයීමට ලක් කළ යුතුය. පුහුණුව අවසානයේ දී තෘතීක හා වෘත්තීය පුහුණු කොමිසම් සභාවේ ලියාපදිංචි වී ඇති ඇගයීමිකරුවන් විසින් අවසාන ඇගයීම් පරීක්ෂණය සිදුකර ඒ ඒ මට්ටම සඳහා සහතික නිකුත් තරනු ලැබේ.

■ ස්ථානානුරූපී ආධුනිකත්ව පුහුණුව

මෙම පුහුණු ක්‍රමය යටතේ එක් එක් ප්‍රදේශයට ආවේනික වූ කර්මාන්තයෙහි පුහුණුව ලැබීමට ආධුනිකයින් යොමු කරන අතර අදාළ පුහුණු සම්මතයන් අදාළ ආයතනය හා අධිකාරිය සමඟ එක්ව පිළියෙල කරනු ලබයි.





■ ග්‍රාමීය මට්ටමේ ආධුනිකත්ව පුහුණුව

කර්මාන්ත ශිල්පීය මට්ටමේ වෘත්තීන් සඳහා සකස් කරන ලද පුහුණු සම්මතයන්ට අනුකූලව පුහුණුව ලබාදිය නොහැකි ආධුනිකයන් හට ග්‍රාමීය පුහුණු පහසුකම් උපයෝගී කර ගනිමින් ග්‍රාමීය මට්ටමේ සිටින පුහුණුලාභීන් හට පුහුණුව ලබාදීම ඉලක්ක කොට ග්‍රාමීය ආධුනිකත්ව පුහුණු ක්‍රමය හඳුන්වා දී ඇත. මේ සඳහා අවශ්‍ය කරන පුහුණු සම්මත එම ආයතනය සමඟ සාකච්ඡා කොට අධිකාරිය මඟින් පිළියෙල කරනු ලැබේ.

කර්මාන්ත පාදක කර්මාන්ත ශිල්පී ආධුනිකයන්ට සහ ජාතික වෘත්තීය සුදුසුකම සහතිකලාභීන්ට අදාල න්‍යායික දැනුම පුහුණුව මඟින් සහ දුරස්ථ අධ්‍යාපනය මඟින් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

තවද ආධුනිකයන් හට අවශ්‍ය මූලික න්‍යායික හා ප්‍රායෝගික දැනුම යම් කාල පරිච්ඡේදයකදී අදාළ පුහුණු මධ්‍යස්ථානයක් මඟින් ලබා දෙන අතර තවදුරටත් ඔවුන්ට විෂය කරුණු ස්වයං අධ්‍යයනය සඳහා පහසුකම් සලසා දෙමින් මුද්‍රිත තැපැල් මාර්ගික පාඩම් මාලා මොඩියුලද අධිකාරිය මඟින් ලබා දෙනු ලැබේ. පාඩම්මාලා අවසානයේ ඇති ප්‍රශ්නාවලියට ආධුනිකයින් පිළිතුරු ලියා එවනු ලැබීමෙන් පසුව අදාළ නිවැරදි කිරීම් කොට නැවත ඔවුන් වෙත තැපැල් මඟින් යවනු ලැබේ.

මුද්‍රිත පාඩම්මාලා හැදෑරීමේදී පුහුණුවන්නන් මුහුණදෙන ගැටළු හා අපහසුතා නිරාකරණය කිරීමට කාලීනව සති අන්ත පන්ති අධිකාරිය විසින් සංවිධානය කරනු ලැබේ.

මීට අමතරව වෘත්තීයට අදාළ ඉංග්‍රීසි දැනුම දියුණු කර ගැනීම සඳහා ඉංග්‍රීසි පාඩම්මාලා ද මෙම ආධුනිකයන් වෙත ලබා දෙනු ලැබේ.

ආයතනික පුහුණු/ මධ්‍යස්ථාන පාදක ද්විත්ව පුහුණුව



මෙම ක්‍රමය යටතේ ආධුනිකයින් සෘජුවම ජාතික පුහුණු ආයතනයකට හෝ ප්‍රාදේශීය පුහුණු ආයතනයකට නියමිත කාලපරිච්ඡේදයකට අනුයුක්ත කර බඳවා ගනු ලබන අතර ඉන්පසුව පුද්ගලික හෝ රජයේ ආයතනයක කාර්යස්ථ පුහුණුව සඳහා යොමු කරනු ලැබේ. පුහුණු ආයතන හෝ පුහුණු මධ්‍යස්ථාන මඟින් අදාළ න්‍යායික හා ප්‍රායෝගික දැනුම ලබාදෙනු ලැබේ. සමාලෝචිත වසර තුළ අධිකාරිය යටතේ ජාතික ආයතන හතරට (04) අමතරව දිවයිනේ විවිධ ප්‍රදේශවල පුහුණු මධ්‍යස්ථාන 74ක් පවත්වාගෙන යන ලදී. මේවායේ පවත්වන ලද පාඨමාලාවල කාලය මාස 06 සිට අවුරුදු 04 දක්වා වෙනස් වේ.

■ යන්ත්‍රාගාර පුහුණුව

1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 38 (සී) වගන්තියට අනුව මොරටුව, පේරාදෙණිය හා රුහුණු විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂකයින්ගේ ඉංජිනේරු උපාධි සඳහා ද විශ්ව විද්‍යාල සහ අනෙකුත් තෘතීය අධ්‍යාපන ආයතන මඟින් පවත්වාගෙන යනු ලබන ඩිප්ලෝමා පාඨමාලා සඳහා ද අදාළ යන්ත්‍රාගාර පුහුණුව අධිකාරිය මඟින් ලබාදෙනු ලැබේ.





■ කාර්යස්ථ පුහුණුව

අනෙකුත් වෘත්තීය පුහුණු ආයතනවල ආයතනික පුහුණුව සම්පූර්ණ කරන්නන් සඳහා හය මාසයක කාර්යස්ථ පුහුණුව අධිකාරිය මඟින් සපයනු ලබයි. විශේෂයෙන් කාර්මික විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික තරුණ සේවා සභාව සහ අනෙකුත් පිළිගත් රජයේ / පෞද්ගලික ආයතනවල වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පුහුණුව ලැබූවන්ට කාර්මික අංශයේ ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දීම සඳහා මෙම පුහුණුව ආරම්භ කොට ඇත.

කර්මාන්ත ශිල්පී ආධුනිකයින් සහ ජාතික ආධුනිකත්ව සහතික ක්‍රමය යටතේ පුහුණුව අවසන් කළ ආධුනිකයන් සඳහා අවසාන වෘත්තීය පරීක්ෂණය ප්‍රධාන කාර්යාලයේ ඇගයීම් අංශයෙන් පවත්වනු ලැබේ. එසේ වුවද පර්ෂද කාර්යාල පිහිටු වීමත් සමඟ මෙම කටයුතු විමධ්‍යගත කිරීමට අපේක්ෂා කරන බැවින් දැනට තුන් වන පර්ෂද යටතට ගැනෙන කොළඹ, ගම්පහ සහ රත්නපුර දිස්ත්‍රික්කවල පමණක් එම පර්ෂද කාර්යාල මඟින් අවසාන වෘත්තීය පරීක්ෂණය සිදුකරනු ලැබේ.

මීට අමතරව ජාතික වෘත්තීය සුදුසුකම් පරීක්ෂණය (NVQ) සහ ජාතික වෘත්තීය පරීක්ෂණ (NTT) සම්බන්ධ ඇගයීම් ද ප්‍රධාන කාර්යාලය මඟින් සිදුකරයි.

ස්ථානානුරූපී සහ ග්‍රාමීය මට්ටමේ ආධුනිකයන් සඳහා වූ අවසාන වෘත්තීය පරීක්ෂණය අදාළ දිස්ත්‍රික් කාර්යාලය විසින් පවත්වනු ලැබේ.



ජාතික ආයතනයන්හි සියළුම සහතිකපත් අධ්‍යක්ෂ විදුහල්පති හෝ ලේඛකාධිකාරී සමඟ අධිකාරියේ සභාපතිතුමාගේ අත්සනින් යුතුව එම ආයතන මඟින් නිකුත් කරනු ලැබේ.

■ ජාතික වෘත්තීය පරීක්ෂණ හා ජාතික වෘත්තීය සුදුසුකම

මෙම වැඩසටහන මඟින් වෘත්තීය පරීක්ෂණ පවත්වා අදාළ නිපුණතා ඇති ශිල්පීන් හට ප්‍රවීණතා සහතික නිකුත් කිරීම සිදුකරයි. අවිධිමත් පුහුණුව ලැබූ දැනට සේවා කරන නිපුණ ශිල්පීන්ට පිළිගත් වෘත්තීය සහතිකයක් ලබා ගැනීම මඟින් වඩා හොඳ දේශීය හා විදේශීය රැකියාවන් ලබා ගැනීම සඳහා මෙම ක්‍රමය වඩාත් භාවිත කරයි.

දැනට පවතින වෘත්තීය පරීක්ෂණ III ශ්‍රේණිය, II ශ්‍රේණිය සහ I ශ්‍රේණිය ලෙස අර්ධ නිපුණ, නිපුණ, විශිෂ්ට නිපුණ ලෙස මට්ටම් 3 කින් පැවැත්වේ.

ජාතික වෘත්තීය පරීක්ෂණ ක්‍රමය ජාතික නිපුණතා සම්මත නොමැති වෘත්තීන් 10 කට සහ ශ්‍රී ලංකා පරිගණක නිපුණතා සහතිකය නිකුත් කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබයි.

ජාතික වෘත්තීය පරීක්ෂණ ක්‍රමය වර්තමානයේ දී ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ක්‍රමය (NVQ) යටතේ පවතින පෙර ඉගෙනුම් පසු ඇගයීම (RPL) බවට පරිවර්තනය වෙමින් පවති.

මේ සඳහා අවිධිමත් පුහුණුව ලැබූ දැනට සේවා කරන නිපුණ ශිල්පීන්ට පිළිගත් වෘත්තීය සහතිකයක් ලබා ගැනීම මඟින් වඩා හොඳ දේශීය හා විදේශීය රැකියාවන් ලබා ගැනීම සඳහා මඟපාදා දෙනු ලබයි.

මෙම වෘත්තීය ප්‍රවේශය සඳහා ආධුනිකයින්ගේ විශාල ඉල්ලුමක් පවතී. එමෙන්ම මෙහි වෘත්තීය මට්ටම VII දක්වා ශ්‍රේණි සකස්කොට ඇති හෙයින් පුහුණුලාභියාට තමා සම්පූර්ණ කළ මට්ටමේ සිට නැවත ඊළඟ මට්ටම ආරම්භ කළ හැකිවීම සුවිශේෂී තත්ත්වයකි. එමෙන්ම යම් මට්ටමකින් නවතන ලදුව නැවත ආරම්භ කරන්නේ නම් වෙනත් පුහුණු මධ්‍යස්ථානයක් ඔස්සේ එය සම්පූර්ණ කළ හැකිවීමද මෙහිදී පුහුණු වන්නාට ඇති සුවිශේෂී පහසුවකි. මෙහි ඇති සුවිශේෂිතාවය නම් පුහුණු වන්නාට උපාධි මට්ටම තෙක් අධ්‍යයන කටයුතු සිදු කිරීමට ඇති හැකියාව වේ.

■ ජාතික නිපුණතා සම්මත සංවර්ධන

අධිකාරිය මඟින් වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයට අදාළව ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයක් වේ. ජාතික නිපුණතා සම්මත පිළියෙල කිරීමේ නීතිමය බලය පනත මඟින්ම අධිකාරිය වෙත පැවරී ඇත.

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගන්නා වෘත්තීන් සඳහා අදාළ ජාතික නිපුණතා සම්මත සකස් කිරීම සහ වලංගු ගතකිරීම මේ යටතේ සිදු කෙරේ.

ජාතික කාර්මික පුහුණු උපදේශක කමිටුවක් මඟින් සකස් කරනු ලබන ජාතික නිපුණතා සම්මත එක් එක් වෘත්තීන්ට අදාළ සංවර්ධන කමිටුවක් මඟින් සංවර්ධනය කිරීම සහ පුනරීක්ෂණය කිරීම මෙහිදී සිදු කෙරේ.

ජාතික කාර්මික පුහුණු උපදේශක කමිටුව එක් එක් ක්ෂේත්‍රයට සහ වෘත්තීන්ට විශේෂිත වූ පුද්ගලයින්ගෙන් සැලසුම්ලත් කමිටුවක් වන අතර මේ වන විට උපදේශක කමිටු 28 ක් පමණ හඳුනාගෙන ඇත. මෙම එක් එක් කමිටුවකට සාමාජිකයන් 16 දෙනෙකු පමණ ඇතුළත් වේ.

■ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන

පුහුණුවේ යෙදී සිටින සහ පුහුණුව අවසන් කළ යන කොටස් දෙක සඳහාම මෙම වැඩසටහන් පවත්වනු ලැබේ. මෙහි ප්‍රධාන ඉලක්කය පුහුණුව අවසන් කළ පසු ස්වයංරැකියා ආරම්භ කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතාව ලබා දීම වේ.

■ වෘත්තීය මාර්ගෝපදේශනය

පාසල් හැරගිය සහ පාසල් යන සිසුන්ගේ වෘත්තීය පුහුණුව පිළිබඳව සහ විශේෂයෙන් රැකියා වෙළඳපොල පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.



■ කාර්ය මණ්ඩල සංවර්ධනය සහ ප්‍රෝඵෂත්ව සංවර්ධනය

නයිටා ආයතනයේ සේවකයින්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම වැඩසටහන් විවිධ අදියර යටතේ සිදුකරනු ලබන අතර ඔවුන්ගේ රැකියා වැඩකටයුතු වලට සිදුවන බාධාවන් අවම වන පරිදි පවත්වාගෙන යනු ලැබේ.

දත්ත නිරූපණය

වගුව 01 - පුහුණු කිරීමේ කාර්යයන්හි සාරාංශය (විවිධ පුහුණු වර්ගීකරණයන් යටතේ)

2020		බඳවා ගැනීම්		පුහුණුව හැරයාම්		පුහුණුව සම්පූර්ණ කිරීම්		පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව	
		2019	2020	2019	2020	2019	2020	2019	2020
කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව									
ජාතික වෘත්තීය සුදුසුකම (NVQ)		14,333	4,682	4,980	2,216	10,065	6,377	10,700	6,789
කර්මාන්ත ශිල්පී		3,664	1,386	1,606	1,083	3,107	2,532	5,664	3,435
ස්ථානානුරූපී		1,172	812	212	603	1,027	731	800	278
ග්‍රාමීය මට්ටම		491	402	99	281	291	323	362	160
විශේෂ පුහුණු වැඩසටහන (බන්ධනාගාර, ආබාධිත පුද්ගලයන්)		3,946	3,525	124	571	3,910	1,679	138	1,413
මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව									
පූර්ණ කාලීන	ජාතික වෘත්තීය සුදුසුකම නොවන (Non NVQ)	658	593	250	523	861	451	592	211
	ජාතික වෘත්තීය සුදුසුකම (NVQ)	3,690	921	738	413	3,397	2,306	3,095	1,297
අර්ධ කාලීන		697	216	-	95	918	321	219	19
ජාතික ආයතන									
පූර්ණ කාලීන		1,337	1,327	764	395	1,029	686	2,810	3,056
අර්ධ කාලීන		995	343	610	86	905	224	80	113
එකතුව		**30,983**	**14,207**	**9,383**	**6,266**	**25,510**	**15,630**	**24,460**	**16,771**
වෙනත්									
විශේෂ කර්මාන්ත පුහුණුව		11,365	3,962	-	-	9,592	8,284	7,822	3,500
රැකියාස්ථ පුහුණුව		12,872	8,064	1,253	897	12,621	8,167	2,408	1,408
එකතුව		**55,220**	**26,233**	**10,636**	**7,163**	**47,723**	**32,081**	**34,690**	**21,679**

කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සමස්තයක් ලෙස 2020 වසරේදී බඳවා ගන්නා ලද ආධුනිකයන් සංඛ්‍යාව 26,233 ක් වූ අතර එය 2019 වසර හා සැසඳීමේදී ප්‍රතිශතයක් වශයෙන් 52.51%ක අඩුවීමක් පෙන්නුම් කරයි. මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුවට සාපේක්ෂව කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව කෙරෙහි නැඹුරුවක් පෙන්නුම් කළද, 2019 වසර හා සැසඳීමේදී එහි අඩුවීමක් පෙන්නුම් කරයි. අනෙකුත් අංශ හා සසඳන විට NVQ වෘත්තීය සුදුසුකම සඳහා ආධුනිකයන්ගේ බඳවා ගැනීමේ පසුබෑමක් දක්නට ලැබේ. පුහුණුව හැරයාම පෙර වසර හා සැසඳීමේදී NVQ හා කාර්යස්ථ පුහුණුව සැළකිය යුතු අඩුවීමක් පෙන්නුම් කළත්, අනෙකුත් පුහුණු හැරයාමේ ප්‍රතිශතය වැඩි අගයක් ගනී. එහිදී ස්ථානුරූපී හා ග්‍රාමීය ආධුනිකත්ව පුහුණුවල හැරයාමේ ප්‍රතිශතය 65%ක් වූ සමාන අගයක පැවති අතර, වැඩිම පුහුණු හැරයාම් ප්‍රතිශතයක් වන 78% ක ප්‍රමාණයක් වාර්තා වූයේ විශේෂ පුහුණු (බන්ධනාගාර/ආබාධිත පුද්ගලයන්) වැඩසටහන යටතේ ය.

මධ්‍යස්ථාන පාදක පුහුණුව සඳහා බඳවා ගැනීමේ ප්‍රතිශතය, 2019 වසර හා සැසඳීමේදී කිසියම් ප්‍රමාණයක අඩුවීමක් පෙන්නුම් කරන අතර, පූර්ණ කාළීන ජාතික වෘත්තීය සුදුසුකම් සහතික (NVQ) ක්‍රමය යටතේ සිදුකල බඳවා ගැනීම් වල 75% ක පමණ අවපාතනයක් පෙන්නුම් කෙරේ. එහිදී අර්ධකාලීන පාඨමාලා යටතේ 2019 වසරේ කිසිදු පාඨමාලා හැරයාමක් පෙන්නුම් නොකළ ද, සිසුන් 95ක් පාඨමාලා හැරයාමත්, 2020 වසරේ පෙන්නුම් කරයි. පෙර වසර හා සැසඳීමේදී සෑම අංශයකම අනුයුක්ත කිරීම්, හැරයාම් හා පාඨමාලා සම්පූර්ණ කිරීමෙහි අඩුවීමක් පෙන්නුම් කරයි.

ප්‍රස්ථාරය 01 : පුහුණු කිරීමේ කාර්යන්හි සාරාංශය (වසර 16ක් තුළ)



ආධුනිකයන් බඳවා ගැනීම් තුළ ආධුනිකයන් ප්‍රමාණය, ආධුනිකයන් පුහුණුව හැර යාම සහ ආධුනිකයන් පුහුණුව සම්පූර්ණ කිරීම, පෙර වසර 16 සමඟ සැසඳීම මෙමඟින් සිදු කරයි. සමස්තයක් වශයෙන් ආධුනිකයින් බඳවා ගැනීමේ ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කළද, පෙර වසර කිහිපය හා සැසඳීමේදී 2020 වසරේදී දක්නට ලැබුනේ ඍණාත්මක හා පහළ අඩුවීමකි. සමස්ථ ආධුනිකයන් සංඛ්‍යාව, පුහුණුව සාර්ථකව නිම කිරීම යන අංශ කෙරෙහි අවපාතනයක් මෙම වසරේදී දක්නට ලැබේ. පෙර වසර 03 ක කාළය තුළදී පුහුණුව හැරයාමේ ප්‍රතිශතය මධ්‍යස්ථ මට්ටමක පැවතියත්, එහි සාපේක්ෂ අඩුවීමක් මෙම වසරේදී දක්නට ලැබේ.

ප්‍රස්ථාරය 02 - විවිධ පුහුණු වර්ගීකරණයන් යටතේ පුහුණුවට බඳවා ගැනීම



අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය මඟින් සංවිධානය කරන ලද පාසල් සිසුන් සඳහා පවත්වන ලද වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන

නුවර දිස්ත්‍රික් කාර්යාලය



නුවර දිස්ත්‍රික්කයේ රැකියා 100,000 වැඩසටහන ආරම්භක අවස්ථාව



ලෝක පරිසර දිනය නිමිත්තෙන් දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍රයේ ඖෂධ පැළ රෝපණය කිරීමේ අවස්ථාව



නයිටා නාමය ප්‍රවර්ධනය වෙනුවෙන් EDEX ප්‍රදර්ශනයට සහභාගි වූ අවස්ථාව



13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන පිළිබඳ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන

බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය



2020 නව වසරේ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ බදුල්ල දිස්ත්‍රික් කාර්යාලයේ වැඩ කටයුතු ආරම්භ කිරීම.



ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලීය පරිශ්‍රයේ පැවති රැකියා පොළ වෙනුවෙන් බදුල්ල දිස්ත්‍රික් කාර්යාලයේ නියෝජනය.



බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය සංවිධානය කළ පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන "රිවර් සයිඩ්" හෝටල් පරිශ්‍රයේදී පැවැත්විණි.



සභාපතිතුමාගේ සහභාගීත්වයෙන් පැවති දිස්ත්‍රික්කයේ ප්‍රගති සමාලෝචන රැස්වීම.



රැකියා 100,000 වැඩසටහන සඳහා තෝරාගත් පිරිස වෙනුවෙන් වෘත්තීය ලැදියාව පිළිබඳ පරීක්ෂණය (Career Key Test) සිදුකරන අවස්ථාව



රැකියා 100,000 වැඩසටහනේ ප්‍රතිලාභීන් සඳහා න්‍යායාත්මක පන්ති ඇරඹීම.

ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය



2020 ලෝක තරුණ කුසලතා දිනය වෙනුවෙන් ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ශෂික සුමනසේන මහතා සම්මානය ලබා ගන්නා ලදී.



ලබුදූව කෘෂිකර්ම විද්‍යාලයේදී පැවති කේෂේත්‍ර සහයක කෘෂිකර්ම පාඨමාලාවේ සමාරම්භක උත්සවය





අක්මීමන ජාතික තරුණ සේවා සභා පුහුණු මධ්‍යස්ථානයේදී රුකියා 100,000 වැඩසටහනෙහි පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන නිමවීමෙන් අනතුරුව න්‍යායික වැඩසටහන් ආරම්භ කිරීම.



රුකියා 100,000 වැඩසටහනේ ප්‍රතිලාභීන් සඳහා න්‍යායාත්මක පන්ති ඇරඹීම.



ගාල්ල දිස්ත්‍රික් යොවුන් සේනාංක පරිශ්‍රයේ පවත්වන ලද නායකත්ව හා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන ආරම්භක අවස්ථාව

යාපනය දිස්ත්‍රික් කාර්යාලය





යාපනය දිස්ත්‍රික්කයේ රැකියා 100,000 වැඩසටහන ආරම්භක අවස්ථාව





රැකියා 100,000 වැඩසටහන යටතේ අවසන් වෘත්තීය තේරීම පරීක්ෂණය සිදුකරන ලද අවස්ථාව





රැකියා 100,000 වැඩසටහනෙහි වෘත්තීය ලැදියාව පරීක්ෂණය (Career Key Test) සිදුකරනු ලබන අවස්ථාව





පාසල් හැරගිය සිසුන් උදෙසා වෘත්තීය මාර්ගෝපදේශනය සිදුකරන අවස්ථාව

මුලතිව් දිස්ත්‍රික් කාර්යාලය





මුලතිව් දිස්ත්‍රික්කයේ ආධුනිකත්ව පුහුණුව සාර්ථකව නිම කළ ආධුනිකයින් සඳහා සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ උත්සවයක් දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍රයේදී පවත්වන ලදී.







රුකියා 100,000 වැඩසටහන ආරම්භ කිරීම සඳහා බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තුමේන්තුව සමඟින් වෘත්තීය පුහුණුව ලබාදීමේ වැඩසටහන දියත් කිරීම සඳහා මූලික සාකච්ඡා පැවැත්වීම හා ආරම්භක උත්සවය පැවැත් වීම.

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියට මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් රු.1,145,831,954.45 සහ උපයන ලද ආදායම් රු.45,237,469.14 සම්බන්ධ විස්තර පහත පරිදි වේ.

රජයේ ප්‍රදාන	**වෙන් කිරීම් (රු)**	**මුදාහරින ලද මුදල (රු)**
භාණ්ඩාගාර ප්‍රදාන-පුනරාවර්තන	1,201,500,000.00	1,083,500,000.00
භාණ්ඩාගාර ප්‍රදාන -ප්‍රාග්ධන	81,000,000.00	43,250,000.00
නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන	39,734,000.00	19,081,954.45
එකතුව	1,322,234,000.00	1,145,831,954.45
ඔස්ට්‍රේලියානු ව්‍යාපෘතිය	-	-
CEB NAITA ඒකාබද්ධ ව්‍යාපෘතිය	-	-
එකතුව	1,322,234,000.00	1,145,768,954.45
ඇස්තමේන්තුගත අනෙකුත් ආදායම්	30,000,000.00	45,237,469.14
එකතුව	1,352,234,000.00	1,191,006,423.59
ආධාර ලැබීම්		759,900.00
මුළු එකතුව		**1,191,766,323.59**

පහත සඳහන් සංරචක සහිත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා මෙහි ඉදිරිපත් කෙරේ.

මූල්‍ය ප්‍රකාශයේ සංරචක:

01. 2020 දෙසැම්බර් 31 දිනට **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**
02. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තරාත්මක ආදායම් **ප්‍රකාශය**
03. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ **ප්‍රකාශය**
04. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීම් **ප්‍රකාශය**
05. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

.....
කේ. ඒ. ඩී. නමරා රම්පාලනා
ගිණුම් නිලධාරී

.....
එන්. ඩබ්. නයෝමි සඳමාලී
අධ්‍යක්ෂ (මූල්‍ය) රා.ඉ

.....
Dr. W.M.S. Wijesinghe
Director General
National Apprentice & Industrial Training Authority

.....
W. Ruchika Amarasekara
Chairman
National Apprentice & Industrial Training Authority

මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම කළමනාකරණ මණ්ඩලය හා බැඳේ.
මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත් අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන්	2020 (රු.)		2019 (රු.)	
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපල පිරියත හා උපකරණ	2	2,751,699,145.18		2,841,060,680.62	
ප්‍රාග්ධන වැඩ ප්‍රගතිය	3	32,775,840.63	2,784,474,985.81	48,775,006.97	2,889,835,687.59
ජංගම වත්කම්					
තොගය	4	14,600,300.45		15,090,936.78	
ලැබිය යුතු දෑ	5	102,009,332.25		107,900,622.40	
කැන්පතු, සුර්ව ගෙවීම් සහ අත්තිකාරම්	6	20,368,461.79		28,702,899.51	
කෙටිකාලීන ආයෝජන	7	78,350,101.37		72,444,808.51	
මාර්ගස්ථ මුදල්	8	762,831.05		10,068,238.84	
මුදල් හා මුදල් සමානයන්	9	177,604,288.31	393,695,315.22	108,619,212.07	342,826,718.11
මුළු වත්කම්			**3,178,170,301.03**		**3,232,662,405.70**
කොටස් සහ වගකීම්					
සමුච්චිත අතිරික්තය/(හිඟය)	11	936,910,721.41		992,148,711.14	
සමුච්චිත අතිරික්තය අර්ධ කාලීන	11a	42,671,516.72		36,228,874.50	
සංචිත	11b	522,598,339.35		428,930,480.06	
රජයේ ප්‍රදාන-ප්‍රාග්ධන	11c	12,499,162.90		11,213,031.84	
රජයේ ප්‍රදාන -SSDP	11d	62,789,506.99		67,389,151.99	
විලම්බිත ආදායම	13	1,113,606,890.65	2,691,076,138.02	1,192,289,150.58	2,728,199,400.11
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික ප්‍රතිපාදන	12	260,766,245.50	260,766,245.50	239,339,472.00	239,339,472.00
ජංගම වගකීම්					
ගෙවිය යුතු	10	226,327,917.51	226,327,917.51	265,123,533.59	265,123,533.59
මුළු කොටස් සහ වගකීම්			**3,178,170,301.03**		**3,232,662,405.70**

සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 8 සිට 19 දක්වා සටහන් ආකෘති පත්‍ර මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසකි.

සහතික කිරීම

ඉහත මූල්‍ය ප්‍රකාශන මගින් 2020 දෙසැම්බර් 31 දිනට සිදු කළ කටයුතු සහ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි අතිරික්තය/(හිඟය) පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බව අපි සහතික කරමු.

කේ. ඒ. ඩී. නමරා රම්‌යාලෙනා
ගිණුම් නිලධාරී

එම්. ඩබ්. නයෝමි යදමාලි
අධ්‍යක්ෂ (මූල්‍ය) රා. ඉ

Dr. W.M.S. Wijesinghe
Director General
National Apprentice & Industrial Training Authority

W. Ruchika Amarasekara
Chairman
National Apprentice & Industrial Training Authority

මෙම මූල්‍ය ප්‍රකාශනය පළකෙරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම කළමනාකරණ මණ්ඩලය හා බැඳේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත් අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

ජාතික ආධුනිකත්ව සහ පුහුණු කිරීම් අධිකාරිය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තරාත්මක ආදායම් ප්‍රකාශය

විස්තරය	සටහන්	2020 (රු.)	2019 (රු.)
මෙහෙයුම් ආදායම			
රජයේ ප්‍රදාන - පුනරාවර්තන		1,083,500,000.00	1,161,995,000.00
රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන පුනරුත්තාපනය		4,131,349.37	5,291,729.69
ස්වයං උත්පාදක ආදායම්	11a	-	-
මාරුකල විලම්බිත ආදායම්	13	120,666,730.84	122,748,469.41
වෙනත් ආදායම්			
ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන		16,592,926.99	50,070,021.11
අනෙකුත් ආධාර	14	8,961,505.52	12,485,425.04
ඕස්ට්‍රේලියානු ව්‍යාපෘතිය			
ලං.වි.ම හා නයිටා ඒකාබද්ධ ව්‍යාපෘතිය			
වෙනත් ආදායම්	15	55,559,579.48	114,540,315.92
මුළු ආදායම		**1,289,412,092.20**	**1,467,130,961.17**
මෙහෙයුම් වියදම්			
Training Consumables පුහුණු ද්‍රව්‍ය	16	11,966,251.50	7,480,896.83
වෙනත් පුහුණු වියදම්	17	94,988,254.78	208,982,251.27
කාර්ය මණ්ඩල වියදම්- පෞද්ගලික චේතන	18	719,683,691.90	823,626,446.38
කාර්ය මණ්ඩල වියදම්-වෙනත්	19	61,227,575.74	70,098,938.73
ප්‍රවාහන හා සන්නිවේදන	20	57,036,260.64	70,200,947.54
සැපයුම් සහ කාර්යාල අවශ්‍යතා	21	20,527,602.70	22,783,627.31
උපකරණ නඩත්තුව	22	6,432,302.79	11,621,683.75
පරිශ්‍ර නඩත්තුව	23	128,792,638.48	184,462,000.01
මූල්‍ය හා වෙනත් වියදම්	24	7,870,914.28	11,843,860.38
ක්ෂයවීම්	25	223,859,441.94	241,520,451.13
විගණන ගාස්තු		735,617.32	1,680,866.19
සම්පූර්ණ මෙහෙයුම් වියදම්		**1,333,120,552.07**	**1,654,301,969.52**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ අතිරික්තය (හිඟය)		**(43,708,459.87)**	**(187,171,008.35)**
අතිරික්ත/හිඟ පිළිබඳ සමුච්චිත ප්‍රකාශය			
නයිටා අරමුදල			
කලින් වාර්තා කරන ලද පරිදි ජනවාරි 1 වන දිනට		1,163,368,948.25	(832,388,817.12)
එකතු කරනලද අතිරික්තය/(හිඟය) ස්වයංක්‍රීයව උත්පාදනය කරන ලදී		-	15,950,771.24
පෙර වර්ෂයේ ගැළපීම්		(11,529,529.82)	
වසර තුළ පෙර වර්ෂයේ ගැළපීම්		1,151,839,418.43	1,995,757,765.37
පෙර වර්ෂයේ ගැළපීම් නයිටා අරමුදල් විවෘත ශේෂය	0		
පසුගිය වසරේ රඳවා ගත් ඉපැයීම්		(171,220,237.15)	
අර්ධ කාලීන			
කලින් වාර්තා කරන ලද පරිදි ජනවාරි 1 වන දිනට අර්ධ කාලීන		36,228,874.49	39,693,917.31
පෙර වර්ෂයේ ගැළපීම්		6,442,642.23	252,991.52
වර්ෂයේ ගැළපීම්		-	874,744.50
නැවත සඳහන් කර ඇති පරිදි ජනවාරි 1 වන දිනට		1,023,290,698.00	1,220,141,372.82
කාල සීමාව සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)		(43,708,459.87)	(187,171,008.35)
දෙසැම්බර් 31 වැනි දිනට ශුද්ධ අතිරික්තය/(හිඟය)		**979,582,238.13**	**1,032,970,364.47**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විස්තරය	සටහන්	2020 (රු.)		2019 (රු.)	
මෙහෙයුම් ක්‍රියාකාරකම්					
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය(හිඟය)		(43,708,459.87)		-187,171,008.35	
ගැලපීම්:					
ක්ෂයවීම්		223,859,441.94		241,520,451.13	
විලම්බිත ආදායම්		(120,666,730.84)		(122,748,469.41)	
වත්කම් බැහැර කිරීමේ පාඩුව		3,198.67		-	
වත්කම් බැහැර කිරීමේ ලාභය		(4,067.25)		(32,752.19)	
බොල් ණය කාර්ය මණ්ඩල ණය		219,550.00		29,393.61	
විවිධ ණයකරුවන් සඳහා බොල් ණය		(112,549.51)			
පෙර වෂ් ගැලපුම් නයිටා ගිණුමේ ලාභය.		(15,935,510.46)		-	
උපචිත සඳහා ඉක්මවූ ප්‍රතිපාදන		(4,047,562.97)			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		49,348,349.50		54,559,381.14	
පාරිතෝෂික ගෙවීම්		(27,921,576.00)		(20,496,702.14)	
තොග වැඩිවීම්/අඩු වීම		490,636.33		(1,762,788.00)	
අය විය යුතු දේ අඩු/වැඩි වීම්		5,891,290.15		4,195,792.74	
තැන්පතු, කලින් ගෙවීම් සහ අත්තිකාරම්වල අඩු/වැඩි වීම්		8,334,437.72		12,912,814.81	
කෙටිකාලීන ආයෝජන අඩු /වැඩි වීම්		(5,905,292.86)		4,177,345.06	
ගෙවිය යුතු දේ අඩු/වැඩි වීම්		(38,795,616.08)		65,577,854.73	
		-	74,757,998.34		237,932,321.48
මෙහෙයුම් ක්‍රියාකාරකම් නිසා උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය			31,049,538.47		50,761,313.13
ආයෝජන ක්‍රියාකාරකම්					
පිරියත හා උපකරණ මිලදී ගැනීම		(22,004,275.21)		(156,765,350.69)	
වැඩ කෙරෙමින් පවතින ප්‍රාග්ධනයන්		15,999,166.34		70,444,547.65	
ස්ථාවර වත්කම් විකිණීම්වලින් ඉදිරියට		-		33,281.00	
විලම්බිත ආදායම් අතිරේකයන් ගැළපීම්		-		-	
ආයෝජන ක්‍රියාකාරකම් නිසා උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය			(6,005,108.87)		(86,287,522.04)
මූල්‍ය ක්‍රියාකාරකම්					
රජයේ ප්‍රදාන ප්‍රාග්ධන		39,118,650.63		50,208,270.31	
SSDP ප්‍රාග්ධන		2,426,027.46		27,621,285.75	
ලද ආධාර		759,900.00		-	
ලද ස්ථාවර තැන්පතු පොලී		(7,669,339.24)		7,712,910.34	
කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ Boundry Wall Fund		-			
ආයෝජන කටයුතු නිසා උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය			34,635,238.85		85,542,466.40
මුදල් හා මුදල් වලට සමාන ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)			59,679,668.45		50,016,257.49
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන			118,687,450.91		68,671,193.42
කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමාන			**178,367,119.36**		**118,687,450.91**

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය

විස්තරය	සමුච්චිත අරමුදල	රජයේ ප්‍රදාන ප්‍රාග්ධන	SSDP ප්‍රාග්ධන	විලම්බිත ආදායම් ප්‍රදාන (වගකීම්)	ආධාර ලැබීම්	අර්ධ කාලීන ගිණුම් මත ලාභය	යකුරුපැදි ආදායම් සංචිත	අර්ධ කාලීන ප්‍රාග්ධන සංචිත	අර්ධ කාලීන අනිවාර්යය සංචිත	AETI ඉඩම් හුවමාරු කිරීමේ ලාභය	නැවත තක්සේරු කිරීමේ සංචිතය	එකතුව
2020 ජනවාරි මස 01 දිනට ශේෂය	**1,163,368,948.25**	**11,213,031.85**	**67,389,151.99**	**1,192,289,150.75**	**113,603,559.55**	**36,228,874.49**	**7,415,059.28**	**11,148,914.78**	**5,902,130.56**	**290,860,815.72**	**-**	**2,899,419,637.22**
එකතුකිරීම්: වර්ෂය තුළ ගනුදෙනු					759,900.00							**759,900.00**
වගකීම් ගිණුම් වෙත මාරු කළ පුස්තකාල අරමුදල												**-**
ඉපැයීම් රඳවා ගැනීම්	(171,220,237.15)											**(171,220,237.15)**
නැවත සඳහන් කර ඇති ආරම්භක ශේෂය	**992,148,711.10**	**11,213,031.85**	**67,389,151.99**	**1,192,289,150.75**	**114,363,459.55**	**36,228,874.49**	**7,415,059.28**	**11,148,914.78**	**5,902,130.56**	**290,860,815.72**	**-**	**2,728,959,300.07**
GOSL වසර සඳහා ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන		43,250,000.00	2,426,027.46									**45,676,027.46**
ප්‍රාග්ධන පුනරුත්ථාපන		(4,131,349.37)										**(4,131,349.37)**
වසරේ ලාභය	(43,708,459.87)											**(43,708,459.87)**
වෂීය සඳහා ගැලපීම්	(11,529,529.82)					6,442,642.23						**(5,086,887.59)**
පෙර වසරේ ඉපැයීම් රඳවා ගැනීම්												**-**
RDA ලද ආධාර												**-**
මෝටර් රථ සඳහා නැවත තක්සේරු කිරීමේ ලාභය											92,907,959.29	**92,907,959.29**
විලම්භිත වගකීමට මාරු කිරීම්		(37,832,519.57)	(7,025,672.46)	44,858,192.03								**-**
විලම්භිත ආදායමට මාරු කිරීම්				-123,540,451.96								**(123,540,451.96)**
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**936,910,721.41**	**12,499,162.91**	**62,789,506.99**	**1,113,606,890.82**	**114,363,459.55**	**42,671,516.72**	**7,415,059.28**	**11,148,914.78**	**5,902,130.56**	**290,860,815.72**	**92,907,959.29**	**2,691,076,138.03**

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

දේපල පිරියන හා උපකරණ

	ඉඩම්	බදු සමඟ පවතින ඉඩම්	ගොඩනැගිලි සහ වැඩිදියුණු කිරීම්	යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	ගෘහ භාණ්ඩ , සවිකුරු හා කාර්යාල උපකරණ	පරිගණක උපාංග	මෝටර් රථ	පුස්තකාල පොත්	පුහුණු උපකරණ	අස්පෘශ්‍ය වත්කම්	එකතුව
පිරිවැය හෝ තක්සේරුකරණය											
වසර ආරම්භක ශේෂය	48,168,918.74	353,769,026.64	2,501,231,629.44	90,510,894.11	312,229,730.26	414,984,254.51	126,354,444.07	12,518,713.08	1,328,423,780.93	21,595,067.58	5,209,786,459.36
වැඩිවීම්: වර්ෂය තුළ එකතු කිරීම	-	-	2,490,136.01	-	10,902,666.25	6,012,149.00	-	20,000.00	2,633,194.26	-	22,058,145.52
වර්ෂය තුළ නැවත තක්සේරු කිරීම	-	-	-	-	-	-	93,265,000.00	-	-	-	93,265,000.00
වැඩිවීම්/අඩුවීම්: ගැලපුම්	-	-	23,392,900.54	-	74,879.97	-	(126,354,444.07)	-	-	-	(102,886,663.56)
අඩුවීම්: බැහැර කිරීමේ ගැලපීම්	-	-	-	-	-	-19,956.00	-	(225.00)	-	-	(20,181.00)
වසරේ අවසාන ශේෂය	**48,168,918.74**	**353,769,026.64**	**2,527,114,665.99**	**90,510,894.11**	**323,207,276.48**	**420,976,447.51**	**93,265,000.00**	**12,538,488.08**	**1,331,056,975.19**	**21,595,067.58**	**5,222,202,760.32**
සමුච්චිත ක්ෂයවීම්											
වසර ආරම්භක ශේෂය	-	9,860,391.55	672,504,425.50	39,694,717.28	227,924,890.06	350,471,819.56	125,941,456.11	10,657,499.47	925,942,960.02	5,727,590.65	2,368,725,750.20
වැඩිවීම්: වර්ෂය තුළදී මුදල් වෙන් කිරීම	-	452,458.33	-	-	-	-	-	-	-	-	452,458.33
වැඩිවීම්: වර්ෂය තුළ ක්ෂය වීම	-	-	112,003,858.20	5,953,855.76	18,403,303.52	25,549,627.42	11,770,019.60	246,528.40	47,459,436.73	2,020,382.57	223,407,012.19
වැඩිවීම්/අඩුවීම්: ගැලපුම්	-	-	2,901,238.80	895,149.15	59,516.86	-	(125,997,403.46)	6,838.93	78,646.83	-	(122,056,012.89)
අඩුවීම්: බැහැර කිරීමේ ගැලපුම්	-	-	-	-	(6,042.38)	(19,550.32)	-	-	-	-	(25,592.70)
වසර අවසාන ශේෂය	-	**10,312,849.88**	**787,409,522.50**	**46,543,722.19**	**246,381,668.06**	**376,001,896.66**	**11,714,072.25**	**10,910,866.80**	**973,481,043.58**	**7,747,973.21**	**2,470,503,615.14**
ලිඛිතව සටහන් කල වටිනාකම											
2020 දෙසැම්බර් 31 දිනට	**48,168,918.74**	**343,456,176.76**	**1,739,705,143.49**	**43,967,171.92**	**76,825,608.42**	**44,974,550.85**	**81,550,927.75**	**1,627,621.27**	**357,575,931.61**	**13,847,094.37**	**2,751,699,145.18**
2019 දෙසැම්බර් 31 දිනට	**48,168,918.74**	**343,908,635.74**	**1,828,727,203.85**	**50,816,176.83**	**84,304,839.91**	**64,512,434.95**	**412,987.96**	**1,861,213.60**	**402,480,995.90**	**15,867,477.14**	**2,841,060,884.62**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොදු ගිණුම් ප්‍රතිපත්ති

1. වාර්තා කිරීමේ ආයතනය

1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ස්ථාපිත කොට ඇති ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (මින් ඉදිරියට ආයතනය ලෙස සඳහන් කෙරේ) අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය යන ලිපිනයෙහි පිහිටා ඇත.

2. සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත සහ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම මත ආයතනයේ මූල්‍ය වාර්තා සකස් කර ඇත.
මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය මත සකස් කෙරේ. මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා රුපියල් වලින් සටහන් කොට ඇත.

2.1 මූල්‍ය වර්ෂ 2020 තුළදී, ටැලි පද්ධති ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන සඳහා වන ශේෂයන් සැසඳුම සඳහා ජාතික මධ්‍යස්ථානවල අර්ධකාලීන පාඨමාලා සම්බන්ධ ගනුදෙනු ටැලි පද්ධතියට ගෙන ඇත.

3. සංසන්දනාත්මක තොරතුරු

3.1 පසුගිය වර්ෂයට අදාළ අගයන් අදාල වසරේ ඉදිරිපත් කිරීම් සමඟ අදාළ වන පරිදි ගලපා ඇත.

4. රජයේ ප්‍රදාන සහ ආධාර

4.1 සංවිධානයේ වියදම් රජයේ ප්‍රදාන මත රඳා පවතින එම ප්‍රදාන ලැබීම් ලෙස ගිණුම්ගත කර ඇත. පුනරාවර්තන වියදම් සඳහා අදාල රජයේ ප්‍රධාන විස්තරාත්මක ආදායම් ප්‍රකාශයට බැර කර ඇති අතර ප්‍රාග්ධන වියදම් සඳහා ලැබීම් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අරමුදලට බැර කර ඇත.

4.2 වත්කම් මාරු කිරීම් ලෙස ලැබෙන රජයේ ප්‍රදානයන් විලම්භීත ආදායම් ලෙස සලකා ඒවායේ ආයුකාලය අනුව ගිණුම් ගත කර ඇත

5. වත්කම් සහ තක්සේරු කිරීම් පදනම

5.1 තොග

තොග සාමාන්‍යයෙන් පිරිවැය මත තක්සේරු කරනු ලැබේ. යල් පැන ගිය මුද්‍රිත ද්‍රව්‍ය තොග සඳහා 5%ක වෙන් කිරීමක් කර ඇත.

5.2 ලැබිය යුතු

අයවිය යුතු ප්‍රමාණයන් එපරිද්දෙන් දක්වා ඇති අතර 2020.12.31 දින වන විට අධිකාරියේ සේවය නොකරන සේවකයින් ගේ අඩමාන සහ බොල් ණය සඳහා 100% ප්‍රතිපාදන ලබා දී ඇත. අභ්‍යන්තර ගනුදෙනු වලින් අයවිය යුතු ණය හැර අනෙකුත් සියලුම ණයකරුවන් සඳහා 5% ප්‍රතිපාදන බොල් සහ අඩමාන ණය ලෙස ලබා දී ඇත.

5.3 දේපල, යන්ත්‍ර සහ උපකරණ

(අ) පිළිගැනීම සහ මිනුම්

දේපල,යන්ත්‍ර සහ උපකරණ සමුච්චිත ක්ෂයවීම හෝ අපහායන අලාභ වියදම් අඩු ආකාරයෙන් දක්වා ඇත.

(ආ) පිරිවැය

දේපල, පිරියත හා උපකරණවල පිරිවැය තුළ ඒවා මිලදී ගැනීම් සහ වැඩදායී තත්වයට ගෙන ඒම සඳහා දැරූ සෘජු පිරිවැය ද අන්තර්ගත වේ.
අධිකාරියේ කාර්යසාධනය පවත්වාගෙන යාම හෝ වැඩිදියුණු කිරීම සඳහා ස්ථීර වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා වූ පසුකාලීන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකේ.

(ඇ) භාණ්ඩ ලේඛනය - කෙටි කාලීන

ප්‍රාග්ධනය කරගත නොහැකි කෙටි කාලීන භාණ්ඩ අයිතම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට කපා හැර ඇත. කෙසේ වෙතත්, මෙම අයිතම පාලනය කිරීමේ අරමුණින් ලේඛනගත කර ඇති අතර භෞතික වශයෙන් ද පාලනය සිදු කෙරේ.

(ඈ) ක්ෂය වීම්

ක්ෂයවීම ගණනය කරනු ලබන්නේ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය මත සරල රේඛීය පදනමකිනි.

වත්කම් කාණ්ඩය	**ක්ෂය වීම් අනුපාතය**
බදු සමඟ පවතින ඉඩම්	කල් බදු කාලය තුළ
ගොඩනැගිලි	5%
යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	10%
ගෘහ භාණ්ඩ , සවිකුරු හා කාර්යාල උපකරණ	10%
පරිගණක උපාංග	25%
පුස්තකාල පොත්	10%
මෝටර් රථ	25%
අස්පෘශ්‍ය වත්කම්	10%

5.4 මුදල් හා මුදල් සමාන

අතැති මුදල්, බැංකු තැන්පතු, කෙටි කාලීන ආයෝජන, මුදල් හා මුදල් සමාන ලෙස අර්ථ දැක්විය හැක.
අතැති මුදල් සහ බැංකු තැන්පතු, කෙටි කාලීන ආයෝජන, මාර්ගස්ථ මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී මුදල් හා මුදල් සමාන ලෙස සැලකේ.

6. වගකීම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍රයේ දිනට ඇති සියලුම වගකීම් මුදල් ප්‍රකාශයට ඇතුළත් කර ඇති අතර දැනටමත් පවතිනවා යැයි සැලකෙන වගකීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දී ඇති නමුත් ඒවායේ වටිනාකම නිවැරදිව ගණනය කළ නොහැක. ඉල්ලුම මත සිදුකළ යුතු ගෙවීම් හෝ ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත සිදු කළ යුතු ගෙවීම්, මූල්‍ය ප්‍රකාශයේ වර්තමාන වගකීම් ලෙස සැලකේ. ශේෂ පත්‍රයේ දින සිට වසරකට පසුව සිදුකළ යුතු ගෙවීම් ජංගම-නොවන වගකීම් ලෙස මුදල් ප්‍රකාශයේ සැලකේ.

6.1 පාරිතෝෂික ප්‍රතිපාදන

සියළුම සේවකයින්ට ආරම්භක වර්ෂයේ සිට ගෙවිය යුතු පාරිතෝෂික දීමනා සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වුවද, 1983 අංක 12 දරන ප්‍රතිපාදන පනතට සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 16වන වගන්තියට අනුව සේවකයෙකු කෙරෙහි මෙම වගකීම බල පැවැත්වෙන්නේ වසර 5 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කළ විටය.

6.2 නිශ්චිත දායක සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා ගෙවිය යුතු දායක මුදල්,වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේදී සැලකේ. අධිකාරිය සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා සේවකයින්ගේ දළ වැටුපෙන් 15% සහ 3% ට නොඅඩු මුදලකින් දායක වේ.

7. ආදායම්

රජයෙන් ලද ආධාර, පුනරාවර්තන වියදම් ලෙස ලද දේශීය හා විදේශීය ආධාර සහ අධිකාරියේ විවිධ ආදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට බැර කර ඇත. ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ප්‍රධාන අලුත්වැඩියාවන් සහ ප්‍රාග්ධන වත්කම් වැඩිවීම් සඳහා වියදම් කළ මුදල් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ප්‍රාග්ධනිත කර නොමැති අතර සමාන මුදලක් ප්‍රාග්ධන ප්‍රදානවලින් මාරු කර ඇත.

ස්ථාවර වත්කම්වල හඳුනාගත් වගකීම් සහ ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ලැබීමෙන් පසු අතිරික්තය/ හිඟය හෝ වියදමට වඩා වැඩි ආදායම ඇති විය.

අධිකාරිය ක්‍රියාත්මක කිරීමේදී සහ එහි ප්‍රාග්ධන වත්කම් පවත්වාගෙන යාමේදී සිදුවන වියදම් අයහාරගත කර ඇත.

8. ප්‍රාග්ධන කැපවීම් සහ අවිනිශ්චිත වගකීම්

සියළු ද්‍රව්‍යමය ප්‍රාග්ධන කැපවීම් සහ අවිනිශ්චිත වගකීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය වෙනස් කිරීම් හෝ අනාවරණය කිරීම් සිදු කරනු ලැබේ.

9. ශේෂ පත්‍රයේ දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍රයේ දිනට පසුව සිදු වූ සිදුවීම් සලකා බලා අවශ්‍ය අවස්ථාවන්හිදී ගිණුම් තුළ අවශ්‍ය වෙනස්කම් සිදු කර ඇත.

10. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විලම්භිත ආදායම් අඩුවීම්/ වැඩිවීම් මුදල් නොවන සංචලනයන් සේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. VOT/D/NAITA/1/20/04

මඹේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 මැයි 26 දින

සභාපති

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරිය

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අයිකාරමයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 9 අනුව ගේෂ පත්‍ර දිනෙන් පසු සිදුවීම් වලට අදාලව ප්‍රමාණාත්මක බලපෑම් ඇති කරවන සිදුවීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කරන බව දක්වා නිබුණද 2021 වර්ෂයේ පෙබරවාරි හා මාර්තු මාසයන්හිදී හීන්දු ලබාදී නිබුණු නඩු 3 කට අදාළව ගෙවිය යුතුව පැවති එකතුව රු.12,942,552 ක් වූ වන්දි සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතම සෑම වර්ෂ 3 කට හෝ 5 කට වරක් ප්‍රත්‍යාගණනය කලයුතු වුවත් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් පිරිවැය රු. 5,083,432,015 ක්වූ දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතම ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත්වන වත්කම් පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කලයුතු වුවත්, සමලෝචිත වර්ෂය තුළදී මෝටර් රථ වාහන ප්‍රත්‍යාගණනය කිරීමේදී අධිකාරියේ පවත්නා මෝටර් රථ 15 ක් ප්‍රත්‍යාගණනයෙන් අත්හැරී තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව තක්සේරු කර නොතිබීම හේතුවෙන් පිරිවැය රු. 1,216,781,413 ක්වූ වත්කම් වර්ග 07 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර නිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. එසේ වුවත් එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෘෂ්ඨය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව නැවත ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 8 හි 22 ඡේදය ප්‍රකාරව අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් අස්ථිත්වයට ප්‍රවර්ථන බැදීමක් ඇති විට එම බැදීමේ ප්‍රමාණය අනුව ඇතිවිය හැකි අසම්භාව්‍ය බැරකම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවසානයට පවතින නඩු 8 කට අදාලව ඒ අනුව කටයුතු නොතිබුණි.

(ඊ) 2018 අප්‍රේල් 03 දින සිට වැඩ අවසන් කර දැනට භාවිතා කරමින් පවතින රු. 1,261,908 ක් වූ ගොඩනැගිලි ප්‍රාග්ධනිත කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර එම ගොඩනැගිලි වලට අදාල ක්ෂය වියදම්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුලදී පරිගණක මෘදුකාංග හා ජාලකරණය වෙනුවෙන් දරන ලද රු. 7,950,619 ක මුදල අස්පෘශ්‍ය වත්කම් යටතේ ප්‍රාග්ධනිත කිරීම වෙනුවට රු.6,781,722 ක් පුනරාවර්ථන වියදම් ලෙස හා රු. 1,168,897 ක් ජංගම වත්කම් යටතේ අත්තිකාරම් ලෙස දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 6,781,722 කින් හා ජංගම වත්කම් රු. 1,168,897 කින් වැඩියෙන් ද අස්පෘශ්‍ය වත්කම් රු. 7,950,619 කින් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුලදී චීන තානාපති කාර්යාලයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු. 5,316,000 ක් වටිනාකමැති පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර හා 2013 හා 2014 වර්ෂවලදී Deutsche Gesellschaft Fur International Zusammehar beit (GIZ) ව්‍යාපෘතියෙන් කිලිනොච්චිය දිස්ත්‍රික් කාර්යාලය වෙත ලැබී තිබුණු රු. 6,475,926 ක් වටිනාකමැති දේපල පිරියත උපකරණ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(එ) ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම යටතේ සිදු කරනු ලබන "Multi Purpose Development Task Force Training Programme 100,000" ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ අරමුදල්වලින් වැය කළ රු. 12,470,721 ක් ප්‍රතිපූර්ණය කරගත හැකි ආදායමක් ලෙස හඳුනාගැනීමට කටයුතු නොකර අදාල වියදම පමණක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනනවල දැක්වුණි.

(ඒ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය යටතේ පවතින කිලිනොච්චිය ජර්මානු කාර්මික පුහුණු ආයතනය අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව 2020 ජනවාරි මාසයේදී රත්මලාන ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට පවරා දී තිබුණද එම පවරා දීමට අදාල රු. 290,115,476 ක් වූ වත්කම් හා රු. 984,094 ක් වූ වගකීම් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. තවද එම ආයතනය වෙත ජර්මන් ආධාර

යටතේ ලබාදී තිබුණු පිරිවැය රු. 1,212,751,835 ක් වූ වත්කම් හා රු. 1,615,789, 921 ක් වූ හිමිකම්, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශවල ගිණුම්ගත කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම

ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට එන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අයිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගත්තා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අයිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අයිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, වපුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (අ), (ඇ) හා (ඇ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික නත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති /විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 760	පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව සේනපුර පුහුණු මධ්‍යස්ථානයට අයත් වර්ග 13 ක පුහුණු උපකරණ අයිතම 108 ක ඌනතාවයක් පැවති බව විගණනයේදී අනාවරණය විය.
(ආ) 2018 ජූලි 18 දිනැති අංක 03/ 2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය	භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සිය ආයතනවලට කාර්යමණ්ඩලය බඳවාගැනීම් හා කාර්යමණ්ඩල වෙත වැටුප් හා දීමනා තීරණය කිරීමෙන් වැලකිය යුතු බව අවධාරණය කර තිබියදී 2018 හා 2019 වර්ෂ තුලදී භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනම මත 47 දෙනෙකු බඳවාගෙන දීමනා ගෙවා තිබුණි.
(ඇ) 2017 අප්‍රේල් 20 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත බඳවාගැනීම් හා උසස්වීම් පටිපාටිය	i. සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස්වීම් ලබාදීම 2013 ඔක්තෝබර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අත්හිටුවා තිබියදී කළමනාකරණ මට්ටමේ නිලධාරීන් 03 දෙනෙකු නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු සඳහා 2015 ජූනි 01 දින උසස්වීම් ලබාදී තිබුණි.එම තනතුරු බලාත්මක නොවන බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් 2016 දෙසැම්බර් 22 දින අධිකාරිය වෙත දැනුම් දී තිබුණද 2022 මාර්තු 15 දින දක්වාම එම තනතුරු අහෝසි කිරීමට කටයුතු කර නොතිබුණි. විගණනය විසින් මෙම කරුණු පෙන්වා දී වසර 1 1/2 කට ආසන්න කාලයක් ගත වී ඇතත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

ii. නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු බලාත්මක නොවන බව දක්වා තිබියදී හා බඳවාගැනීමේ හා උසස්කිරීමේ පටිපාටිය අනුව සුදුසුකම් සම්පූර්ණ නොකල නිලධාරීන් 02 දෙනෙකු සඳහා අධ්‍යක්ෂ තනතුරු ලබාදී තිබුණු අතර එක් නිලධාරියෙකුට 2019 ජූලි 01 දින සිට විගණන දිනය වූ 2022 මාර්තු 15 දින දක්වාම අධ්‍යක්ෂ (පුහුණු) තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 චෙනත් කරුණු

(අ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ලැබිය යුතු ශේෂය තුල වර්ෂ 01 සිට වර්ෂ 15 අතර අයකර නොගත් එකතුව රු. 38,289,653 ක් වූ විවිධ ණයගැති ශේෂ හා වටිනාකම රු. 1,185,654 ක සේවක ණය ඇතුලත් වී තිබූ අතර මෙම ශේෂ අයකර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම ජංගම වත්කම් යටතේ දක්වා තිබිණි.

(ආ) 2020 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු ශේෂය තුල ඇතුළත් වර්ෂ 02 සිට වර්ෂ 13 අතර කාලපරිච්ඡේදයකට අදාළ රු. 92,720,931 ක් වූ ගෙවිය යුතු අත්තිකාරම්, තැන්පතු ශේෂ හා විවිධ ණයහිමියන් නිරවුල් කිරීමට හෝ වගකීමක් නොමැති ශේෂ පොත්වලින් ලියාහැරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) ඔරුගොඩවත්ත මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ ආයුධ ගබඩාවේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛනය 2011 වර්ෂයේ දී අවධාරණය වී තිබූ නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබූ අතර දැනට ගබඩාව තුල පවතින භාණ්ඩ /උපකරණ නිවැරදිව හඳුනාගෙන විධිමත් අනුමැතියට යටත්ව නව ඉන්වෙන්ට්‍රි ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කටුබැද්ද කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ ආධුනිකයන් විසින් නිෂ්පාදනය කරනු ලබන ලීබඩු අලෙවි කිරීමේ අරමුණින් 2014 සිට 2016 කාලපරිච්ඡේදය තුල රු. 18,847,771 ක් වැයකර ආයතන භූමියේ ඉදිකර තිබුණු ප්‍රදර්ශනාගාරය හා ඔරුගොඩවත්ත මෝටර්රථ කාර්මික ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ රු. 9,172,400 ක් වැයකර 2019 දෙසැම්බර් මාසයේ ඉදිකිරීම් නිමකර තිබුණු ශිෂ්‍ය නේවාසිකාගාරය හා කාර්යමණ්ඩල නේවාසිකාගාරයන් උපකරණ සමහම විගණිත දිනය වූ 2022 මාර්තු 15 දින දක්වාම භාවිතයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ඉ) 2007 සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු. 8,732,754 ක අධිභාර මුදල හා ගෙවිය යුතු හිඟ සේවක අර්ථසාධක අරමුදලේ සේවකයන්ගෙන් අයකල යුතු දායක මුදල වූ රු. 58,908,280 ක් අදාල නිලධාරීන්ගේ අයකර ගැනීම වෙනුවට අධිකාරියේ ඉකුත් වර්ෂයේ ලාභයෙන් හා සමාලෝචිත වර්ෂයේ ලාභයෙන් අඩුකර තිබුණි.

(ඊ) පොළොන්නරුව දිස්ත්‍රික්කය තුල 2012 වර්ෂයේදී වසා දමා ඇති පුහුණු මධ්‍යස්ථානයක පුහුණු උපකරණ 297 ක් වසර 07 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(උ) ඔරුගොඩවත්ත මෝටර්රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ 2020 වර්ෂය සඳහා පූර්ණකාලීන පාඨමාලාවන් සඳහා ආධුනිකයින් බඳවාගැනීමේ විවෘත තරඟ විභාගයේදී ආධුනිකයින් තෝරා ගැනීමේ කටයුතු වංචනික අයුරින් සිදුකිරීම හේතුවෙන් සුදුසුකම් ලබා තිබුණු ආධුනිකයින් 30 දෙනෙකු සිටියදී සුදුසුකම් නොලැබූ ආධුනිකයින් 20 දෙනෙකු තෝරාගෙන තිබුණි. මෙම කරුණු විගණනය විසින් පෙන්වා දී වසර 2 කට ආසන්න කාලයක් ගත වී තිබුණද අකුමිකතා සිදුකල නිලධාරීන් සම්බන්ධයෙන් 2022 මාර්තු 15 දින දක්වාම කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඌ) අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කෙරෙන 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩ සටහනෙහි පළමු පියවර යටතේ 2019 වර්ෂයට අදාලව බඳවාගත් සිසුන් 186 දෙනෙකු වෙනුවෙන් රු. 2,170,814 ක් වැයකර පුහුණුව සම්පූර්ණ කර සහතික පත් පුහුණුලාභීන් 20 දෙනෙකුට පමණක් ලබා දී තිබුණි.

ඩබ්ලිව්.ජී.සී. වික්‍රමරත්න
විගණකාධිපති